# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 46 — 1973 පෙබරවාරි 09 වැනි සිකුරාදා — 1973.02.09

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී).


## I වැනි කොටස: (II අ) වැනි ඡේදය – පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 159 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 173 |


## තනතුරු - ඇබෑර්තු

සැලකිය යුතුයි.—අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 02 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සහීමාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්‍ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පලවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

7. අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) ස්වකීය අයදුම් පත්වලට අමුණා එවිය යුතුය.

(i) ශාස්ත්‍රීය සුදුසුකම් පිළිබඳ සහතිකයක් :

(ii) අයදුම්කරුවන්ගේ චරිතය, සුදුසුකම්, හැකියාව තෝරාගනු ලැබීමට සුදුස්සකු වීම ආදී කරුණු ඇතුළත් ළඟදී ලබාගත් සහතික දෙකක්.

(iii) උත්පත්තිය ලියා පදිංචි කිරීමේ සහතිකය. (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නියෝග සංග්‍රහයේ කාර්‍යාර්ථය වෙනුවෙන් නිකුත් කළ උප්පැන්න සහතිකය හෝ පිළි නොගනු ඇත.)

සැ. යු.—සහතික පත්‍රවල පිටපත් අයදුම්කරුවන් වෙත ආපසු එවනු නොලැබේ. යම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එම අවස්ථාවේදී පමණක් මෙම සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

8. අයදුම්පත් හෝ ඊට අදාළ වන වෙනත් ලියකියවිලි හෝ ආධුනිකත්ව අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, මණ්ඩලයේ අන් කිසිදු නිලධාරියෙකු පුද්ගලිකව ඇමතිය යුතු නොවේ.

9. අයදුම් පත් ලැබුණ බව දන්වනු නො ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
ආධුනිකත්ව අධ්‍යක්ෂ.

ජාතික ආධුනිකත්ව මණ්ඩලය,
30, විජේරාම මාවත,
කොළඹ 7,
1973 ජනවාරි මස 31 වන දින.

**ආකෘති අයදුම් පත්‍රය**

සිව් පිටපතකින් යුතුව එවිය යුතුය.

**අයදුම් පත්‍රය**

**1971 අංක 49 දරණ ජාතික ආධුනිකත්ව පනත යටතේ ආධුනිකයින් බඳවා ගැනීම**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ස්ත්‍රී පුරුෂ භාවය :————.
3. ස්ථිර තැපැල් ලිපිනය :————.
4. අයදුම්කරු දැනට පදිංචිව සිටින පළාත් පාලන කොට්ඨාශය සහ දිස්ත්‍රික්කය :————.
5. (අ) උපන් දිනය :————.
   (ආ) 1973.02.01 දිනට වයස : අවුරුදු ——, මාස ——, දින ——.
6. ජාතිය :————.
   (i) ලාංකිකයෙකුවූයේ පරම්පරාවෙන්ද, ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.
   (ii) පරම්පරාවෙන් ලාංකිකයෙකු නම්, පහත සඳහන් අය උපන් ස්ථානය :————.
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා : ——.
7. සමත් වූ විෂයයන් සහ පරීක්ෂණයේ දිනය ඇතුළුව අධ්‍යාපන සුදුසුකම් :————.
   (සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය)
8. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයට වඩා උසස් වූ අධ්‍යාපනික හෝ වෙනත් සුදුසුකම්, :————.
9. අමුණා ඇති චරිත සහතිකයන් ලබාගත් පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.
10. අමතර සුදුසුකම් :————.
11. ප්‍රමුඛත්වය අනුපිළිවෙල අනුව අයදුම්කරු ආධුනිකත්වය ලබා ගැනීමට බලාපොරොත්තු වන වෘත්තීන් 3ක නම් :——.

   (i)
   (ii)
   (iii)

(i) මම මහජන අරමුදල් වලින් දීමනාවක් හෝ වේතනයක් ගෙවනු ලබන්නාවූ පුහුණුවක් ලබා ඇත්තකු නොවන බවත්, දැනට එවැනි පුහුණුවක් නොලබන බවත්,

(ii) මා රැකියාවක නිරත වූවකු නොවන බවත්,

(iii) මෙම අයදුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය සහ නිවැරදි බවත්,

(iv) මවිසින් සපයන ලද තොරතුරු අසත්‍ය නම්, ආධුනිකත්ව පුහුණුව සඳහා නුසුදුස්සකු විය හැකි බව පිළිගන්නා බවත්, මෙයින් සහතික කරමි.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2-317—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**රජයේ විද්‍යාලයන්හි I ශ්‍රේණියේ මුල්ගුරු තනතුරු සහ II ශ්‍රේණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු තනතුරුවලට සුදුස්සන් බඳවා ගැනීම**

රජයේ සිංහල, දෙමළ, මුස්ලිම් විද්‍යාලයන්හි I ශ්‍රේණියේ මුල්ගුරු සහ II ශ්‍රේණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු තනතුරු වලට ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. සුදුස්සන් තෝරා ගැනීම සඳහා විභාග කොමසාරිස් විසින් 1973 මැයි මස 19 වෙනි දින විභාගයක් පවත්වනු ඇත. විභාගය පැවැත්වෙන මධ්‍යස්ථාන පසුව දන්වනු ලබන අතර, එක් එක් අධ්‍යාපන ප්‍රදේශවල විභාග මධ්‍යස්ථාන පිහිටවනු ඇත. පොදු යහපත පිණිස මෙම විභාගය අවලංගු කිරීම අවශ්‍ය වේ යයි හෝ විභාගය කල් දැමීම අවශ්‍ය වේ යයි හෝ අධ්‍යාපන අමාත්‍යාංශය අදහස් කළහොත්, එසේ කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය සතු ය. තවද, පොදු යහපත පිණිස කළ යුතුයයි අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සලකනු ලැබුවහොත් පුරප්පාඩු කිසිවක් හෝ සියල්ලම හෝ නො පුරවා හැරීමේ අයිතිය ද අධ්‍යාපන අමාත්‍යාංශය සතු ය.

2. **ඉල්ලුම් කළයුතු පිළිවෙල :—**

(අ) ප්‍රාදේශීය/දිස්ත්‍රික් අධ්‍යාපන කාර්‍යාල මගින් නිකුත් කරනු ලබන අයදුම් පත් නියමිත පරිදි සම්පූර්ණ කර, 1973.3.7 වෙනි දිනට හෝ ඉන් පෙර තමා දැනට සේවය කරනු ලබන විදුහල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාට/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි වරයාට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු ය. අයදුම් පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, I*/II* ශ්‍රේණියේ මුල්ගුරු තනතුර—"සිං*/දෙ*/මු*" යනුවෙන් අයදුම් කරන තනතුරේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය. (අනවශ්‍ය වචන කපා හරින්න). නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නො ලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි ඉල්ලුම් කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(ආ) මුද්‍රිත ඉල්ලුම් පත් පෝර්ම තමා දැනට සේවය කරනු ලබන අධ්‍යාපන ප්‍රදේශයේ/දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කාර්‍යාල වලින් ලබා ගත හැකිය. ඉල්ලුම් පත් පෝර්ම ඉල්ලුම් කරන විට අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් 9'' × 4'' ප්‍රමාණයට කුඩා නොවූ තම ලිපිනය ලියනලද මුද්දර නොගැසූ ලියුම් කවරයක් යැවිය යුතු ය. එම ලියුම් කවරයේ ඉහළ කෙළවරේ "ඉල්ලුම් පත් පෝර්මය—මුල්ගුරු තනතුරු සඳහා පැවැත්වෙන තරග විභාගය" යන වචන පැහැදිලිව සඳහන් කළ යුතු ය. එක් අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට එක් පෝර්මයකට වඩා නිකුත් කරනු නො ලැබේ.

(ඇ) එක් එක් දිස්ත්‍රික්කයේ පවතින ඇබෑර්තු සඳහා එම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ. සිංහල අයදුම් කරුවන් සම්බන්ධයෙන් මෙම තනතුරු සඳහා කොළඹ දකුණ, හෝමාගම, ගම්පහ, කළුතර යන අධ්‍යාපන දිස්ත්‍රික්ක හැර දිවයිනේ අනිකුත් අධ්‍යාපන දිස්ත්‍රික්කවල පමණක් ඇබෑර්තු ඇත. දෙමළ අයදුම් කරුවන් සම්බන්ධයෙන් යාපනය දිස්ත්‍රික්කයේ හැර සෙසු දිස්ත්‍රික්ක වල ඇබෑර්තු පවතී. එබැවින් ඉල්ලුම් පත්‍රයේ පළමුවෙනි කොටුව අනුව ඉල්ලුම් කරන අධ්‍යාපන දිස්ත්‍රික්කය පැහැදිලිව සඳහන් කළ යුතුය. එය කිසිම හේතුවක් නිසාවත් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ. ඉල්ලුම් කරන දිස්ත්‍රික්කයේ අඩු වශයෙන් අවුරුදු 3 ක් වත් සේවය කළ යුතුය.

3. වැටුප් පරිමාණය:—

3.1. පළමුවැනි ශ්‍රේණියේ මුල්ගුරු තනතුරු

වර්ෂයකට රු. 3,720—8 × 90—11 × 144—6,024 (ඒකාබද්ධ) (කා.ක.ඉ. 4,872 පෙර)

69.10.1 දිනට පෙර ක්‍රියාත්මක වූ මිට අනුරූප කල්පිත වැටුප් ක්‍රමය වර්ෂයකට (රු. 1,560—10 × 72—9 × 120—රු. 3,360) (කා. ක. ඉ. 2400 ට ඉපර)

නියමිත ප්‍රමාණයන්ට අනුව විචාහක දීමනාව ගෙවනු ලැබේ. කායයීක්ෂමතා කඩඉමෙන් සමත්වීම සඳහා සේවාස්ථ පාඨමාලා පහකට සහභාගි විය යුතු ය.

3.2. දෙවෙනි ශ්‍රේණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු තනතුරු
වර්ෂයකට රු. 3,450—11 × 90—9 × 144—5,736 (ඒකාබද්ධ)
(කා.ක.ඉ. 4,584 ට පෙර)
69.10.1 දිනට පෙර ක්‍රියාත්මක වූ මීට අනුරූප කල්පිත වැටුප් ක්‍රමය
වර්ෂයකට රු. 1,308—11 × 72—9 × 120—3,180
(කා.ක.ඉ. 2,220 ට පෙර)
නියමිත ප්‍රමාණයන්ට අනුව විවාහක දීමනාව ගෙවනු ලැබේ. කායයීක්ෂමතා කඩඉමෙන් සමත් වීම සඳහා සේවාස්ථ පාඨමාලා පහකට සහභාගි විය යුතු ය.

4. **වයස් සීමාව :—**

අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු විය යුතු ය.

5. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—**

5.1 මුල්ගුරු I ශ්‍රේණිය—

(අ) රජයේ විද්‍යාලයක මුල්ගුරු II ශ්‍රේණියේ අවුරුදු එකක සේවය ඇති, II ශ්‍රේණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු වරයෙකු ; හෝ

(ආ) පුහුණුවෙන් පසු අවුරුදු 8 ක සේවයක් ඇති රජයේ විද්‍යාලයක සේවය කරන පුහුණු ගුරුවරයෙකු; හෝ

(ඇ) නුපුහුණු ගුරු සහතික පත්‍රය දරණ රු. 3,360/– කට වඩා ඒකාබද්ධ වාර්ෂික වැටුපක් ලබන නුපුහුණු ගුරුවරයෙකු හෝ විය යුතු ය .

5.2. II ශ්‍රේණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු තනතුරු—

(අ) පුහුණුවෙන් පසු අවුරුදු 5 ක සේවයක් ඇති රජයේ විද්‍යාලයක සේවය කරන පුහුණු ගුරුවරයෙකු; හෝ

(ආ) නුපුහුණු ගුරු සහතික පත්‍රය දරණ රු. 3,120/– කට වඩා ඒකාබද්ධ වාර්ෂික වැටුපක් ලබන නුපුහුණු ගුරුවරයෙකු හෝ විය යුතුය.

5.3. විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතු ය.

**සටහන.**—(අ) මෙහි සඳහන් කර ඇත්තේ අයදුම්කරුවන්ට අඩුම වශයෙන් තිබිය යුතු සුදුසුකම් ය. ඉගැන්වීම් සම්බන්ධයෙන් අදාල අමතර අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් දරණ අය කෙරෙහි හා බාහිර වැඩ කටයුතු ගැන උනන්දුවක් දක්වා ඇති අය කෙරෙහි ද සම්මුඛ පරීක්ෂණයේ දී වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) උපගුරු/මුල්ගුරු වශයෙන් සේවා කාල ගණන් ගැනීමේ දී වැටුප් රහිත නිවාඩු කාල ගණන් ගනු නො ලැබේ.

6. **බඳවා ගැනීමේ ක්‍රමය :—**

6.1. සුදුස්සන් තෝරා ගනු ලබන්නේ තරග විභාගයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් ය. විභාගයේ දී වැඩිම ලකුණු ප්‍රමාණයක් ගත් අයදුම්කරුවන් අතරින් සාමාන්‍යයෙන් පවතින ඇබෑර්තු සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. විභාගය සඳහා පැය 1½ ප්‍රශ්න පත්‍ර දෙකක් සහ පැය එකක ප්‍රශ්න පත්‍රයක් දෙනු ලබන අතර, එම ප්‍රශ්න පත්‍ර පහත සඳහන් කොටස් තුනින් සමන්විත වනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | අධ්‍යාපන මූල ධර්ම හා ක්‍රම | ...පැය 1½...ලකුණු 150 යි. |
| (ආ) | අධ්‍යාපන නීතිය, පරිපාලනය හා විද්‍යාලයක වේතන, මුදල් පරිහරණය සහ බඩුබාහිරාදිය තබා ගැනීම පිළිබඳ දැනීම | ...පැය 1½...ලකුණු 150 යි. |
| (ඇ) | සාමාන්‍ය දැනීම | ...පැය 1 ...ලකුණු 100 යි. |

6.2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 50 යි.

6.3. තරග විභාගයට පෙනී සිටීම සඳහා විභාග ගාස්තු වශයෙන් රුපියල් 15 ක් වටිනා මුද්දර ඉල්ලුම් පත්‍රයෙහි ඇලවිය යුතු ය.

7. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :—**

7.1. මෙම තනතුරු ස්ථිර ය.

7.2. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවුරුද්දක වැඩ බැලීමේ කාල පරිච්ඡේදයකට යටත්ව අලුත් තනතුරට පත් කරනු ලැබේ. තනතුරු ස්ථිර කිරීමෙන් පසු මුදල් රෙගුලාසි අනුව ශ්‍රේණිය උසස් කරනු ලැබූ දින සිට නියමිත වැටුප් ක්‍රමයෙහි ඔවුන් පිහිටු වනු ඇත.

7.3. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිසත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම පිණිසත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද රා සේ.කො. නියෝග, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහ රෙගුලාසි සහ ආණ්ඩුව විසින් කලින් කල නිකුත් කරනු ලබන අනෙකුත් නියෝග හෝ රෙගුලාසි වලටද අනුකූලව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ක්‍රියා කළයුතු වේ.

7.4. තෝරාගනු ලබන්නේ එක් එක් දිස්ත්‍රික්කයේ ඇති ඇබෑර්තු අනුවයි. පත්වීම් ලබන අයට අවුරුදු 3 ක් යන තුරු මාරුවීමක් ලැබීමට හිමිකමක් නැත. විනයානුකූල හේතු හා සේවා අවශ්‍යතා උඩ වෙනත් දිස්ත්‍රික්කයකට මාරු කර යැවීමේ අයිතිය දෙපාර්තමේන්තුව සතුව පවතී.

8. **විභාගයට ඇතුලත් කර ගැනීම :—**

(අ) ඉල්ලුම් පත්‍ර පිළිගනු ලැබූ සියලුම අපේක්ෂක/අපේක්ෂිකාවන් වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් තමන් ගේ ප්‍රවේශ පත්‍ර, විභාග මධ්‍යස්ථාන පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නො ලැබේ.

(ආ) තමන්ට නියම කරනු ලැබූ විභාග ශාලාවේ දී අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාගයට පෙනී සිටිය යුතු ය. අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට නියම කරනු ලැබූ මධ්‍යස්ථානයේ හැර වෙනත් මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නො ලැබේ. විභාගයට පෙනී සිටින හැම අපේක්ෂකයෙකුම/අපේක්ෂිකාවකම විභාගය පැවැත්වෙන පළමු දිනයේම, ඔහුගේ/ඇගේ ප්‍රවේශ පත්‍රය, විභාගශාලා පරිපාලක වෙත භාර දිය යුතු ය.

(ඇ) කිසියම් අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට යටත් පිරිසෙයින් විභාගය පවත්වන දිනට සත් දිනකට කලින් වත් තම ප්‍රවේශ පත්‍රය නොලැබුණ හොත්, ඔහු/ඇය විසින් වහාම ඒ බව, කොළඹ 2, තැ. පෙ. 1503, විභාග කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ ලිපිනය—"විභාග" කොළඹ කියා වේ). ප්‍රවේශ පත්‍රය නො ලැබුණු බව විභාග කොමසාරිස් වෙත දැන්වීමේ දී පහත සඳහන් විස්තර ද සැපයිය යුතු ය :—

(අ) විභාගයේ නම :—

(ආ) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම :—

(ඇ) ලිපිනය :—

(ඈ) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ දිනය, ලියා පදිංචි කළ අංකය හා තැපැල් කායයීාලය :—

(ඈ) අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක විභාගයට ඇතුළත් කර ගැනීම ඊට පෙනී සිටීම සඳහා ඔහුගේ/ඇගේ යෝග්‍යතාවය පිළිගැනීමක් නොවේ. කෙසේ වුවද, විභාග කොමසාරිස් හට ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට තාවකාලිකව විභාගයට පෙනී සිටීමට අවසර දිය හැකි ය. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

9 **හැඳන්වීමේ පත්‍ර :—**

අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින හැම විෂයයක් පාසාම විභාග පරිපාලකගේ සතුටට හේතුවන පරිදි, ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාර ගනු ලැබේ.—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනලද අනන්‍යතා පත්‍රයක් ;

(ආ) මෙම විභාග දිනට අවුරුදු 3 කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත්කරන ලද වලංගු විදෙස් ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්) ;

(ඇ) විභාග දිනට අවුරුදු 3 කට වැඩි නොවන කාලයක් ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරීත්වය යටතේ නිකුත් කරනලද අයිතිකරුගේ ජායාරූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ජායාරූපයක් (ඉල්ලුම්කරුගේ අත්සන පසු පිටේ යොදනලදුව, එම අත්සන සහ පසු පිටේ ජායාරූපය ඉල්ලුම්කරුගේම බව දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියෙකු විසින් හෝ සහතික කර තිබිය යුතු ය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනය එහි සඳහන් ව තිබිය යුතු ය. මෙම ජායාරූප පිටපත විභාගශාලාධිපති විසින් රඳවා ගන්නවා ඇත.)

(ඉ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක්.

ආචාර්ය පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජනවාරි 30 වන දින,
කොළඹ 2, අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පාසල් පරිපාලන ශාඛාවේදී ය. (පාප/8/539)

මුල්ගුරු උසස්වීම් සඳහා පැවැත්වෙන විභාගයේ නිර්දේශ පත්‍රය

I වැනි ප්‍රශ්න පත්‍රය — අධ්‍යාපන මූලධර්ම හා ක්‍රම

1. **අධ්‍යාපන මූලධර්ම හා ක්‍රම :**

1.1. අධ්‍යාපනය යනු කුමක් ද ? අධ්‍යාපනයේ පරමාර්ථ. විධිමත් අධ්‍යාපනය සහ අවිධිමත් අධ්‍යාපනය (මෙම ශිර්ෂය යටතේ සාමාන්‍ය දැනීමක් බලාපොරොත්තුවනු ලැබේ.)

2. **පහත සඳහන් චින්තකයන්ගෙන් අධ්‍යාපන දර්ශනය පිළිබඳ මූලික අවබෝධයක් :—**

2.1. ජීන් ජේකස් රූසෝ (1712–1778)

2.2. ෆෙඩ්රික් fපිබෙල් (1782–1852)

2.3. මාරියා මොන්ටිසෝරි

2.4. ජෝන් ඩිවි

2.5. මහත්මා ගාන්ධි.

3. **අධ්‍යාපනය හා ආර්ථික සංවර්ධනය :**

3.1. රටේ ආර්ථික සංවර්ධනය සඳහා අධ්‍යාපනයෙන් කළහැකි සේවය. (උදා : පස් අවුරුදු සැලැස්ම සහ අධ්‍යාපනය)

3.2. ආර්ථික සංවර්ධනයට තුඩු දෙන පරිදි අධ්‍යාපන ක්‍රමය ප්‍රති සංවිධානය කිරීම.

3.3. අධ්‍යාපන වැඩ පිළිවෙල රටේ ආර්ථික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සකස් කිරීම.

3.4. වෘත්තීය නැම්මකින් යුතු විෂය මාලා. (උදා: ප්‍රාග් වෘත්තීය විෂයයන්)

3.5. රැකීරක්ෂා හිඟය නැති කිරීමට හෝ අඩු කිරීමට කළයුතු අධ්‍යාපනික වෙනස්කම්.

4. **අධ්‍යාපනය හා සමාජය :**

4.1. අධ්‍යාපන ප්‍රගතියට සමාජයෙන් සිදුවන සේවය.

4.2. සමාජයේ වෙනස්කම් ඇති කිරීමට අධ්‍යාපන ක්‍රමය ඉවහල් කර ගතයුතු ආකාරය.

4.3. සමාජ චලතාව (Social Mobility) සඳහා අධ්‍යාපනයට හිමි කාර්‍ය්‍ය පටිපාටිය.

4.4. අධ්‍යාපන ආයතන සහ සමාජයේ අනිකුත් සංවිධාන අතර සම්බන්ධය.

මෙම ප්‍රශ්න පත්‍රයට සූදානම් වන අපේක්ෂකයන්ට පරිශීලනය කිරීම සඳහා පහත සඳහන් පොත් සහ ප්‍රකාශන ප්‍රයෝජනවත්ය:—

1. අධ්‍යාපන විද්‍යාව—ඩබ්. ආර්. පී. සෝමරත්න
2. ඉගැන්වීමේ මූලධර්ම හා නවීන ක්‍රම—ඩබ්. ආර්. පි.සෝමරත්න
3. පියවර පාඩම් ක්‍රමය—එල්. ජී. හේවගේ
4. තාක්ෂණික සමාජයක අධ්‍යාපනය—' යුනෙස්කෝ '

5. **විෂය මාලා වර්ග විෂය මාලාවක් සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු:**

උදා : I. විනය හා නිදහස; II. ගුරුවරයා සතු විවිධ කාර්යයන්.

6. **පාසලක කටයුතු සංවිධානය කිරීමේදී විශේෂයෙන් සැළකිය යුතු කරුණු:**

6.1. විෂය නිර්දේශයන්, කාලසටහන.

6.2. පාඩම් සටහන්.

6.3. පාසල් විභාග.

6.4. සමුච්චිත සටහන්—ශිෂ්‍යයන්ගේ පෞද්ගලික ලිපිගොනු.

6.5. ගුරු-දෙගුරු සම්බන්ධය.

6.6. ගුරු-ශිෂ්‍ය සම්බන්ධය.

6.7. බාහිර වැඩ සංවිධානය—ක්‍රීඩා, සමිති, උත්සව.

7. **ඉගැන්වීමේ හා ඉගෙනීමේ ආධාර:**

7.1. ක්‍රීඩා හා ක්‍රියාකාරිකම් මගින් ඉගැන්වීම.

7.2. ඩෝල්ටන් ක්‍රමය හා ව්‍යාපාර ක්‍රමය.

7.3. සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශක ක්‍රමය, පර්යේෂණාගාර ක්‍රමය, " විනෙට්කා " ක්‍රමය.

7.4. පියවර පාඩම් ක්‍රමය.

7.5. ප්‍රශ්න ඇසීම සඳහා මාර්ගෝපදේශ.

7.6. පාඩමක් සැලසුම් කිරීම.

8. 8.1. ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන ක්‍රමය :

8.2. අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන දෙපාර්තමේන්තු, අධ්‍යාපන මණ්ඩල, පාසල් අලලා පරිපාලන පිළිබඳව වැඩ පිළිවෙල.

මගේ අංකය : පාප/8/539.

මුල්ගුරු උසස්වීම් සඳහා පැවැත්වෙන විභාගයේ නිර්දේශ පත්‍රය

දෙවෙනි ප්‍රශ්න පත්‍රය

1. **අධ්‍යාපන නීතිය, පරිපාලනය හා විද්‍යාලයක වේතන—මුදල් පරිහරණය සහ බඩුබාහිරාදිය තබා ගැනීම:**

**1.1. අධ්‍යාපන නීතිය—**

1939 සිට මේ දක්වා සංශෝධිත අධ්‍යාපන ආඥපනත් පිළිබඳ සාමාන්‍ය දැනීමක් මින් අපේක්ෂා කරන අතර, මේ සඳහා 1947, 1951, 1953, 1958 වර්ෂවලදී කරනලද සංශෝධන ද අදාල වේ. 1960 අංක 5 දරණ උපකෘත පාඨශාලා සහ ගුරු විද්‍යාල (විශේෂ විධි විධාන පනත) සහ 1961 අංක 8 දරණ පාඨශාලා රජයට පවරා ගැනීමේ පනත ද අදළ වේ.

**1.2. පරිපාලනය (සාමාන්‍ය)—**

(අ) ගුරු වෘත්තියට බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටි හා සේවා කොන්දේසි පිළිබඳ දැනුම—මේ සම්බන්ධයෙන් ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ II සිට VI දක්වා පරිච්ඡේද අදල වේ.

(ආ) **ගුරු වැටුප් හා දීමනා පිළිබඳ කරුණු :**
ගුරු වැටුප් දීම පිළිබඳ සාමාන්‍ය දැනුමක් බලාපොරොත්තු වනු ලැබේ. වැටුප් කොමිෂන් සභා වාර්තා එනම්, 1957 පෝලියර් කොමිෂන් වාර්තාව සහ 1967 වැටුප් විෂමතා කොමිෂන් සභා වාර්තා ද මේ සම්බන්ධයෙන් අදළ වේ.

**1.3. වෙනත් සේවා නියමයන් හා කොන්දේසි—**

(අ) ගුරුවරුන්ගේ නිවාඩු (රාජකාරි නිවාඩු හා අධ්‍යයන නිවාඩු ද ඇතුළුව) පිළිබඳ ක්‍රියා පටිපාටිය—ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදය සහ කලින් කල අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත්කර ඇති චක්‍රලේඛද මෙහිලා අදල වේ.

(ආ) අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර, රාජකාරි සහ නිවාඩු දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම හා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධ ලිපි ලේඛණ තබා ගැනීම, වාර්තා තබා ගැනීම පිළිබඳ සාමාන්‍ය දැනීමක්—

ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ XIII හා — XXVII පරිච්ඡේදයන් සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය විසින් කලින් කල නිකුත් කර ඇති චක්‍රලේඛ අදළ වේ.

(ඇ) ගුරු නිවාස—අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 133 දරණ (අංක එස්1/17 හා 70.2.27 දිනැති) චක්‍රලේඛය අදළ වේ.

(ඈ) ණය සහ අත්තිකාරම් (ලොහෝර් ආර්යා අරමුදල ද ඇතුළුව) වෛද්‍ය පහසුකම් ආදී සුභසාධක පහසුකම් හා අනුග්‍රහ ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ XXV, XXVI සහ XXVIII යන පරිච්ඡේද අදළ වේ.

(ඉ) වෙනත් අයිතිවාසිකම් හා ඒවා භුක්ති විඳීමේ සීමා, ආයතන සංග්‍රහයේ XXXV සිට XXXVII දක්වා පරිච්ඡේද අදල වේ.

(ඊ) සාමාන්‍ය හැසිරීම හා විනය—ආයතන සංග්‍රහයේ XXXII සිට XXXIV දක්වා පරිච්ඡේද අදළ වේ.

**1.4. පරිපාලනය (අභ්‍යන්තර)—**

(අ) පාඨශාලාවේ අභ්‍යන්තර පාලනය, උප ගුරුවරුන්ගේ කටයුතු සමීක්ෂණය, පාසල් ගොඩනැගිලි හා පාසල් ඉඩම්, පොත්පත් හා ලේඛන තබා ගැනීම, පැමිණීමේ ලේඛනය, ලොග් සටහන් පොත්, දිවා ආහාර ලේඛන, බඩුබාහිරාදිය පිළිබඳ ඉන්වෙන්ටරි පොත්, පුස්තකාල පොත්, නොමිලයේ පාසැල් පොත් සැපයීම, පාරිභෝගික ගබඩා පොත් ආදිය පිළිබඳ දැනුම—අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය විසින් කලින් කල නිකුත් කර ඇති චක්‍රලේඛ අදළ වේ.

(ආ) ලිපිගොනු කිරීමේ ක්‍රම පිළිබඳ සාමාන්‍ය දැනුම—භාණ්ඩාගාරයේ ක්‍රම සංවිධාන අංශය මගින් නිකුත් කර ඇති රජයේ දෙපාර්තමේන්තුවල කාර්යාල ක්‍රමය නමැති පොත අදළ වේ. විද්‍යාලයකට ලැබෙන ලිපි ක්‍රමානුකූලව තබා ගැනීමේ ක්‍රම.

**1.5. විද්‍යාලයක වේතන, මුදල් පරිහරණය හා බඩුබාහිරාදිය තබාගැනීම—**

(අ) විද්‍යාලයක පඩි නඩි, මුදල් ගෙන ඒම හා ගෙවීම, වැටුප් ලේඛන පිළියෙල කිරීම, පාසල් වැටුප් ලේඛනයක් තබා ගැනීම ආදී කරුණු.

(ආ) පාරිභෝගික බඩු ලේඛනය, ඉන්වෙන්ටරි හා පාසලේ අනිකුත් පොත් පත් තබා ගැනීම.

(ඇ) වාර්ෂික බඩු බාහිරාදිය පිළිබඳ සමීක්ෂණ හා අලාභහානි පිළිබඳ මුල් ගුරුවරයාගේ වගකීම හා ඒ සම්බන්ධව ක්‍රියා කළ යුතු ආකාරය.

(ඈ) මුදල් අය කිරීම් සම්බන්ධව ක්‍රියා කළයුතු ආකාරය සහ ඒ පිළිබඳ පොත්පත් පවත්වා ගෙනයාම—අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය විසින් කලින් කළ නිකුත් කර ඇති චක්‍රලේඛ අදළ වේ.

2. **සාමාන්‍ය දැනීම.**—(තුන්වැනි ප්‍රශ්න පත්‍රය)
දේශීය හා විදේශීය වත්මන් තතු පිළිබඳ සාමාන්‍ය දැනීම.

2–326—72.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

**ශ්‍රී ලංකා යුද හමුදව**

සාමාන්‍ය (ආධුනික) සෙබළුන්

1. ශ්‍රී ලංකා යුද හමුදවේ නිත්‍ය භට සේනාවේ සාමාන්‍ය (ආධුනික) සෙබළුන් බඳවා ගැනීම පිණිස පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවෙකු—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ආ) යටත්පිරිසෙයින් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි අට වෙනි ප්‍රමාණය සමත්ව සිටිය යුතුයි. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අයට විශේෂත්වයක් දක්වනු ලැබේ.

(ඇ) රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය පැහැදිලිව සඳහන් කළ යුතු අතර සනාථ කළ යුතුයි.

(ඈ) උස අඩි 5 යි අඟල් 5 ට අඩු නොවිය යුතුයි.

(ඉ) 1973 මාර්තු 01 වෙනි දිනට අවුරුදු 18 ට නොඅඩුවද, අවුරුදු 22 ට නොවැඩිවද සිටිය යුතුයි.

(ඊ) යුද හමුදු ආඥාපතිතුමාගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණ යකින් සමත් විය යුතුයි.

3. දෙවන ඡෙදයේ (ආ) සහ (ඈ) උප ඡෙදයන්හි දැක්වෙන අධ්‍යාපනික හා ශාරිරික සුදුසුකම් අඩුම වශයෙන් ගැනෙන අවශ්‍යතාවයන් බව සැලකිය යුතුය. මෙම නිවේදනයේ දෙවන ඡෙදයේ දැක්වෙන අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් සලකා බලනු නො ලැබේ.

4. **සේවා කොන්දේසි.**—(අ) සේවා කාලය—සාමාන්‍ය වශයෙන් අවුරුදු 12 ක සේවය සඳහා බඳවා ගනු ලබන සෙබළෙකු, මුල් අවුරුදු 5 නිත්‍ය බල සේනාවේද ඉතිරි අවුරුදු 7 නිත්‍ය උප සේවා බල හමුදවේද සේවය කිරීමෙන් පසු අස් කිරීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සෙබලෙකුගේ නිත්‍ය බල සේනා සේවය අවුරුදු 12 දක්වා දීර්ඝ කර ගැනීමටත්, ඔහුගේ මුල් බැඳීමේ සිට අවුරුදු 32 දක්වා කාලයක් එසේ සේවය කිරීමටත් ඉඩ දෙනු ලැබේ.

(ආ) බඳවා ගැනීමෙන් පසු සෑම සෙබලෙකුම 1949 අංක 17 දරණ යුද හමුදු පනතට හා එහි යටතේ පනවා ඇති ව්‍යවස්ථාවලට හා අණ පනත්වලට යටත් වනවා ඇත.

5. වැටුප් හා දීමනා.—(අ) යුද හමුදවේ නිත්‍ය බලසේනාවේ වෘත්තීය නුපුහුණු සෙසු නිලයින් සඳහා වූ වැටුප් හා දීමනා පහත සඳහන් පරිදිවේ;—

| නිලය | | ඒකාබද්ධ වැටුප (අවුරුද්දකට) |
|---|---|---|
| ආධුනික සෙබල | ... | රු. 2,700 |
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය | ... | රු. 2,880—15 × 60—රු.3,780 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිලය | ... | රු. 3,060—15 × 60—රු.3,960 |
| කෝප්‍රල් හෝ සමාන නිලය | ... | රු. 3,660—15 × 72—රු.4,740 |
| සැරයන් | ... | රු. 4,620—10 × 90—රු.5,520 |
| මණ්ඩලික සැරයන් | ... | රු. 5,010—10 × 90—රු.5,910 |
| බලලත් නිලධාරි II වන පන්තිය | ... | රු. 5,220—10 × 120—රු.6,420 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් | ... | රු. 5,340—10 × 120—රු.6,540 |
| බල ලත් නිලධාරි I වන පන්තිය | ... | රු. 5,640—10 × 144—රු.7,080 |

(ආ) **විවාහක සෙසුනිලයින්ගේ දීමනා.**—රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට අදල පරිදි එම කොන්දේසි සහ ඒ අන්දමට විවාහක සෙසුනිලයින් වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) **රජක දීමනා.**—(1) නේවාසිකව වෙසෙන සෙබලෙකුගේ නිල ඇඳුම් හමුද වියදමින් පිරිසිදු කරනු ලැබේ.

(2) හමුද නිවාසයෙන් බැහැරව වෙසෙන සෙබලෙකුට ඔහුගේ නිල ඇඳුම් පිරිසිදු කිරීම පිණිස යුද හමුදාධිපති විසින් නිගමනය කරනු ලබන දීමනාවකට හිමිකරු වනු ඇත.

(ඈ) **වෙන්ව සිටීමේ දීමනා.**—විවාහක සෙසුනිලයින් තුල වාසය කිරීම සඳහා අණ කළහොත් වෙන්ව සිටීමේ දීමනා ගෙවනු ලැබේ. එම කාල සීමාව තුලදී ආහාර සැපයීමේ වියදම වශයෙන් දිනකට රු. 2 ක මුදලක් අඩු කරනු ලැබේ.

(ඉ) **යහපත් හැසිරීමේ දීමනා.**—පහත සඳහන් ක්‍රමය අනුව ගෙවනු ලැබේ :—

1 වෙනි පදක්කම—අවුරුදු 4 ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 25 යි.

2 වෙනි පදක්කම—අවුරුදු 8 ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 50 යි.

3 වෙනි පදක්කම—අවුරුදු 12 ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 75 යි.

(ඊ) **දුෂ්කර පලාත්වල සේවය කරන සෙසුනිලයින් සඳහා දීමනා.**—

(1) නිවිකා රාජකාරි මන්නාරම සහ යාපනය යන පෙදෙස්වල.

(2) වලවේ, පදවි සහ මුතියම්කච්චිකුලම්වල පිහිටි ගොවි ජනපදවල.

(3) යුද හමුදාධිපති විසින් විධානය කරනු ලබන ඉංජිනේරු යෝජනා ක්‍රමවල.

(උ) **රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට මුදල්දායක ගෙවීම.**—රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා තම දායක මුදල් වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක මුදලක් අඩු කර ගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක්, යුද හමුදවට බැඳීමේදී සෑම සෙබලෙකු විසින්ම දිය යුතුයි·

6. මෙම නිවේදනයේ I වෙනි ඡෙදයේ දැක්වෙන ඇබෑර්තු සඳහා එවනු ලබන ඉල්ලුම් පත් පහත සඳහන් නීතිවලට අනුකූලව විය යුතුයි :—

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයේ අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ අනුසාරයෙන් ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම පුරවන ලද ඒවා විය යුතුයි.

(ආ) ඉල්ලුම් පත්‍ර ''යුද හමුද ආධුනිකයින් බඳවන නිලධාරි, යුද හමුද මූලස්ථානය, තැ.පෙ. 553, කොළඹ'' යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයෙහිද, එය බහාලනු ලබන කවරය මතු පිටද, ''ඉල්ලුම් පත්‍රය නිත්‍ය බලසේනාව—ආධුනික'' යනුවෙන් සඳහන් කල යුතුය. ඉල්ලුම් පත්‍ර 1973 මාර්තු මස 01 වෙනි දින සවස 4.00 පැයට ප්‍රථම යුද හමුද මූලස්ථානයට ලැබිය යුතුය.

(ඇ) ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික වල පිටපත් පමණක් අමුනා එවිය යුතුය :—

(1) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචි කර නොමැති අපේක්ෂකයින් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය (බෞතීස්ම සහතික, ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සංග්‍රහය යටතේ භාවිතයට පමණක් නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ ජන්ම පත්‍රය භාර ගනු නොලැබේ.)

(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(3) ඉල්ලුම්කරුගේ චරිත ශුද්ධිය හා මෙම තනතුර පිළිබඳ යෝග්‍යතාවය ගැන මෑතකදි ලබා ගත් සහතික තුනක්, රක්ෂාවක යෙදි සිටින්නේ නම් මින් එක සහතිකයක් තමාගේ ස්වාමියාගෙන් විය යුතුයි.

(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පිළිබඳ සහතික ආදිය.

**සැළකිය යුතුයි.**—(1) මෙම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කල යුත්තේ ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් පමණි.

(2) ඉල්ලුම් පත්‍රය සමග සහතිකවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැතිවුවහොත් ඊට යුද හමුද මූලස්ථානය වග කියනු නො ලැබේ.

(ඈ) තැපෑලේදී නැතිවන, ප්‍රමාදවන ඉල්ලුම් පත්‍රයක් හෝ ඊට අදල ලිපියක් පිළිබඳව කෙරෙන චෝදනාවක් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) ස්වේච්ඡා හමුදවල සාමාජිකයින් ගේ ඉල්ලුම් පත් ඔවුන්ගේ ඒකක මූලස්ථාන මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඊ) රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(උ) දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබ, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තුවලට ලැබී, යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානින් විසින් ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් නොකරන ලද ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

(ඌ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තේරීමේ මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා තමාගේම වියදමින් පැමිණ පෙනී සිටිය යුතුය. එම ඉල්ලුම්කරුවනට සම්මුඛ පරීක්ෂණය පවත්වන ස්ථානය, දිනය හා වේලාව පුද්ගලිකව දන්වනු ලැබේ.

(එ) තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීමට සුදුසු යයි තෝරා ගන්නා ලද ඉල්ලුම්කරුවන්, වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා තමාගේම වියදමින් කොළඹ දී පෙනී සිටිය යුතු ය.

(ඒ) සම්මුඛ පරීක්ෂණයෙන් සහ යුද හමුද තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන අවශ්‍ය අනිකුත් පරීක්ෂණ වලින් පසුව යුද හමුද නිත්‍ය භට සේනාවේ ආධුනික සෙබල තනතුරට බඳවා ගන්නා අතර යුද හමුද අභ්‍යාස මධ්‍යස්ථානයේ හෝ අන්තැනක පවත්වනු ලබන පුහුණුවීමේ අභ්‍යාස පාඨමාලාවක් අනුගමනය කිරීමට සලසනු ලැබේ.

(ඔ) වයස අවුරුදු 21 ට අඩු අය තමාගේ දෙමාපියන්ගේ හෝ භාරකාරයා ගෙන් කැමැත්ත පලමු කොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම් නිත්‍ය සේනාවට බඳවා ගනු නොලැබේ.

(ඕ) තෝරා පත් කර ගත් සෑම ඉල්ලුම්කරුවෙක්ම ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතුවට පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ක) ඉල්ලුම්කරු රෙකමදරු කිරීමට කැමති කෙනෙකු වේ නම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුගේ තෝරා ගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුසු අයෙකු වීමට ඉඩ තිබේ.

(ග) යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොර තුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුනි නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුසු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුනි නම් විනයානුකූලව දඬුවම් පැමිණවීමටත් රාජකාරියෙන් පහ කිරීමටත් ඉඩ තිබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදාධිපති වෙනුවට.

යුද හමුදා මූලස්ථානය,
තැ.පෙ. 553,
කොළඹ.

**ශ්‍රී ලංකා යුද හමුදවේ නිත්‍ය හට සේනාවේ සාමාන්‍ය (ආධුනික) සෙබලෙකු වශයෙන් බැඳීම සඳහා වූ ආදර්ශ ආකෘති පත්‍රය**

| | |
|---|---|
| අයදුම්කරු ලියාපදිංචි වී ඇති රාජ්‍ය සභා මැතිවරණ කොට්ඨාශය<br>.............................. | අයදුම්කරු අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය<br>.............................. |

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :———, වයස :——— අවුරුදු :———, මාස :———.
4. අධ්‍යාපන සුදුසුකම් :————.
5. උස :— අඩි :————, අඟල් :————.
6. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? :————.
7. විවාහක අවිවාහක බව :————.
8. පාසැලෙන් අස්වූවාට පසු යෙදී සිටි රක්ෂාව :————.
9. මීට ප්‍රථම යුද, නාවික, ගුවන් හා ස්වෙච්ඡා සේවක හමුදවල දැරූ තනතුරු ආදියක් වේ නම් තත්ත්වය හා දිනය ඇතුලුව සම්පූර්ණ විස්තර :————.
10. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා ආදිය) :————.
11. ඉතා කිට්ටු තැපැල්/විදුලි පණිවුඩ කාර්යාලය :————.
12. ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.
13. ඉදිරිපත් කරණ ලද චරිත සහතික ලබා ගත් අයගේ නම් සහ තනතුරු :—
    (අ) :————.
    (ආ) :————.
    (ඇ) :————.
14. කොළඹ සේවා ආරෝග්‍යශාලාවේදී පවත්වන ලද වෛද්‍ය පරීක්ෂණ යකින් අසමත්වීම නිසා ඔබ යුද හමුදවට, නාවික හමුදවට හෝ ගුවන් හමුදවට බඳවා ගැනීම ප්‍රතික්ෂේප කොට තිබේ ද? :————.
15. ඉල්ලුම්කර විසින් අත්සනින් කර සිටින ප්‍රකාශය :—

මා විසින් සපයන ලද ඉහත සඳහන් විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවට මෙයින් සහතික කරමි.

————,
දිනය :————. ඉල්ලුම්කරුගේ අත්සන.

2-346—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය**

අභ්‍යන්තර ගණන් පරීක්ෂක තනතුර

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයයේ අභ්‍යන්තර ගණන් පරීක්ෂක තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබාගන්නා ඉල්ලුම් පත්‍ර මගින් අයදුම් කළ යුතුය.

**සුදුසුකම්.**—1. වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ මධ්‍ය විභාගයෙන් සමත් වීම ; හෝ

2. සර්ටිෆයිඩ් ඇන්ඩ් කෝපරේට් ගණකාධිකාරීන් ගේ ආයතනයේ I, II, සහ III වන කොටස් වලින් සමත් වීම ; හෝ

3. කාර්මික විද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලැබීම.

**පළපුරුදුකම්.**—ගණන් පරීක්ෂණ හෝ ගිණුම් වැඩ පිළිබඳ අඩු වශයෙන් අවුරුදු දෙකක (2) විධායක පළපුරුදුකම් තිබිය යුතුය.

**වයස සීමාව.**—අවුරුදු 35 ට අඩුවිය යුතුය.

**වැටුප් පරිමානය.**—සියලු දීමනා අඩංගුව මසකට රු. 800—10 ×40—රු. 1,200—IV වැනි ශ්‍රේණිය.—තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම් සහ පළපුරුදුකම් අනුව ඉහත සඳහන් වේතන පරිමාණයේ සුදුසු පියවරක තැබීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් සංස්ථාවේ ඕනෑම ආයතනයක සේවය කළයුතු අතර, රජයේ භාෂා ප්‍රතිපත්තියට අනුකූලවීම සඳහා රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන් දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්යි ප්‍රධානීන් මගින් අයදුම්පත් එවිය යුතුය.

අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය, නො. 651, ඇල්විටිගල මාවත, කොළඹ 5 යන ලිපිනයට 1973 පෙබරවාරි මස 20 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

1973 ජනවාරි මස 29 වැනි දින,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය,
651, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 5.

2-342—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව**

සහකාර සැපයීම් අධ්‍යක්ෂ තනතුරු

රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ සහකාර සැපයීම් අධ්‍යක්ෂ තනතුරු දෙකක් සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ. මෙයින් එක් තනතුරක් දැනටමත් රජයේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් පුරවනු ලැබේ.

මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගනු ලබන අයදුම් පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර, කොළඹ 2, තැ. පෙ. 560, විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973 මාර්තු මස 02 වැනිද

(ආ) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1973 මාර්තු මස 02 වැනිද

**සටහන්.**—(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නො ලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) අයදුම් පතක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට තම අයදුම් පත්‍ර විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කර සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වේ.

**2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථ සාධක අරමුදල් පදනමක් මත වනු ඇත. **තෝරාගනු ලබන අපේක්ෂකයා වැටුපෙන් සියයට 6ක** මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් **ගෙවිය යුතුය. රජයේ දායක මුදල ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක්** වනු ඇත. නමුත් රජයේ සේවයෙහි දැනටමත් නියුක්ත ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ අපේක්ෂකයින්ට තවදුරටත් එම විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙනු ඇත.

**(ii) (අ) තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් පත්කරනු** ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත්ව ය. දැනට රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් නියමිත කාලසීමාවකට වැඩ බැලීමකට පත්කරනු ඇත.

(ආ) තෝරාගනු ලබන රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් පත්කරනු ලබන්නේ පළමුවෙන් එක් අවුරුදු කාලසීමාවකට වැඩ **බැලීමේ පදනමක් මතය. එම කාලය අවසානයේ දී නිලධාරියා** සුදුස්සෙකු බව පෙනී ගියහොත් ඔහු තනතුරේ ස්ථිර කරනු ඇත. වැඩබලන කාලය තුළදී ඔහු මෙම තනතුර සඳහා නුසුදුසු බව පෙනී ගියහොත් ඔහු කලින් සිටි තනතුරට ආපසු යවනු ලැබේ.

(iii) තෝරාගනු ලබන බාහිර අයදුම්කරු ආධුනික කාලය තුළදී රජයේ සැපයීම් අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන ගබඩා කටයුතු ඇති රජයේ දෙපාර්තමේන්තුවල පුහුණුවක් ලැබිය යුතුවාක් මෙන්ම සියලුම වර්ගයේ බඩු හා ගබඩා කිරීමේ නව ක්‍රම සහ ගිණුම් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගත යුතුය. **ස්ථිරත්වයට සුදුස්සකු වීමට** පෙර ඔවුන් විසින් ගබඩා පරිපාලනය, දෙපාර්තමේන්තු ගබඩා රෙගුලාසි හා ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි පිළිබඳව පවත් වනු ලබන දෙපාර්තමේන්තු විභාගයකින් සමත් විය යුතුය. ආධුනිකත්වයේ සිටින සහකාර සැපයීම් අධ්‍යක්ෂවරයෙකුට අවුරුදු තුනක් ඇතුළතදී විභාගයෙන් සමත් වීමට නොහැකි වුවහොත්, විභාගයට පෙනී සිටීම සඳහා එක් අවස්ථාවක් හෝ ඊට වඩා අවස්ථා ගණනක් සලසා දීම පිණිස ඔහුගේ ආධුනික කාලය දීර්ඝ කරනු ලැබේ. දෙවැනි වරටත් නොහැකි වුවහොත් සේවය අවසන් කිරීමට සිදු වේ.

3. වැටුප් සහ දීමනා.—වර්ෂයකට රු. 6,720න් පටන් ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් 12 කින් සහ රු. 480 වාර්ෂික වැඩිවීම් 7 කින් වර්ෂයකට රු. 14,400 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් **මෙම තනතුරට අදාලය. එම වැටුප් ක්‍රමයේ රු. 7,800 සහ රු. 11,520ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.**

4. අවශ්‍ය සුදුසුකම් (i) **රජයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා වෙන්වූ තනතුර.**—අයදුම්කරුවන් සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි හෝ ඉන් ඉහළ පන්තියේ නිලධාරීන් විය යුතු අතර, ගබඩා වැඩ සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් ද, ඒ සම්බන්ධ රුචියක් හා සේවය පිළිබඳ ප්‍රශංසනීය වාර්තාවක් ද ඇති නිලධාරීන් විය යුතුය.

(ii) **විවෘත තරඟකරුවන් සඳහා වෙන්වූ තනතුර.**—සෑම අයදුම් කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථකිරීම පිණිස සෑහෙන **දායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—**

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයන් විය යුතුය. ගෞරව පෙළ උපාධිධාරීන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඇ) 1973.03.02 වැනි දිනට වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර හා අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය.

(මෙම වයස් සීමාව දැනට රජයේ සේවයේ සිටින අයට බලපාන්නේ නැත).

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක **ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.**

(අ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකාරක පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික බාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයෙකුගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත හැර කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් **සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු** කරනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයට ලැබුණ බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් **නොලබන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මා වෙත දැනුම්** දියයුතුය.

ජයන්ත කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජනවාරි මස 24 දින,
යූනියන් පෙදෙසේ අංක 330 හි,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)**

රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව—සහකාර සැපයීම් අධ්‍යක්ෂ තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය :—(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :———, මාසය :———, දිනය :——— –.

(ආ) දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

වර්ෂ :————, මාස :————, දින :———.

4. ඔබ ලංකා රටවැසියෙක් ද ? පාරම්පරික රටවැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න) :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

(ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි).

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවක්ද, යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවු. 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ක්‍රීඩා පිළිබඳව ලබාඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද? :————.

11. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක්ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

(ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සමර්ථ, වෘත්තිය සුදුසුකම් වල විස්තර, ඒවායේ දින පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න)

13. දැනට නිරත රක්ෂාව හා ඊට පූර්වයෙන් කරන ලද රක්ෂාවල් :————.

(රක්ෂාවට බැඳුන දිනය ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැළකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම් :————.

(දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතහොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න)

15. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

16. මෙම අයදුම් පතෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගත හොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගත හොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
————,

දිනය :————.

2–354—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

අංකය : විඅා/2/237.

අධ්‍යාපන අමාත්‍යාංශය

ඊජිප්තු අරාබි සමූහාණ්ඩු රජය මගින් ප්‍රදානය කරන ශිෂ්‍යත්ව 1972-73

ඊජිප්තු, අරාබි සමූහාණ්ඩු රජය විසින් පහත සඳහන් ක්ෂේත්‍රයන් යන්හි අධ්‍යාපනය සඳහා පිරිනමන පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

(අ) ඉස්ලාම් නීති.

(ආ) ඉස්ලාම් ධර්මය හා ඉතිහාසය.

(ඉ) අරාබි භාෂාව හා සාහිත්‍යය.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

සංලක්‍ෂ්‍ය 1 : රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

සංලක්‍ෂ්‍ය 2 : මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවක සින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

සංලක්‍ෂ්‍ය 3 : එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. ශිෂ්‍යත්ව කාලය.—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් එක් අවුරුද්දය. (කැමති නම් දීර්ඝ කරගත හැකිය).

එහෙත් අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ඊජිප්තු අරාබි සමූහාණ්ඩුවේ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

3. සුදුසුකම්.—අයදුම්කරුවන් විසින පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(1) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(2) 1972. 12. 31 වැනි දිනට, වයස අවුරුදු 28 ට අඩුවිය යුතුයි.

(3) උගැන්වීමේ කටයුතුවල නිරත, පිළිගත් මඩ්රාසා විද්‍යාලයක මවුලාවිවරුන් හෝ ආරබි භාෂාව විෂයයක් වශයෙන් හැදෑරූ, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයින් විය යුතුයි.

සංලක්‍ෂ්‍ය 1 : ශ්‍රී ලංකා ජනරජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයයක හෝ ශ්‍රී ලංකා ජන රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපෙක්ෂකයන්, ඒ කාලසීමාවේ සේවය සම්පූර්ණ කොට 1972.12.31 වන දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේය.

සංලක්ෂය 2 : එසේම, තාවකාලික තනතුරු දරණ හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේය. එසේ අස්වීමට කමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් : ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත්ය.

(අ) ඊජිප්තු අරාබි සමූහාණ්ඩුවට යාමට හා ආපසු ඒමට සංචාරක පංතියේ ගුවන් ගමන්,

(ආ) මාසික දීමනාවක්,

(ඉ) නොමිලයේ නවාතැන් පහසුකම්.

සංලක්ෂය : මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීතිරීතීන්ට යටත් වන්නේය.

5. සම්මුඛ පරීක්ෂණය.— සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. ගිවිසුම.—තෝරාගනු ලබන අපේක්ෂකයන් ඊජිප්තුව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජන රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ශිෂ්‍යත්වයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයට හා ප්‍රධාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියළුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දුවන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

**7. වෛද්‍ය පරීක්ෂණය :** තෝරාගනු ලබන අපේක්ෂකයන් ඊජිප්තුවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට ද ශ්‍රී ලංකා ජන රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට ශ්‍රී ලංකා ජන රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම්පත්, **1973.02.24** වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ
ලේකම්

1973 ජනවාරි මස 29 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

2–290—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය.

---

## මහා භාණ්ඩාගාරය

### සහකාර අධ්‍යක්ෂ තනතුර (සංස්ථා අංශය)

මහා භාණ්ඩාගාරයේ, සංස්ථා අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මේ නිවේදනයට යා කොට ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කළයුතු වන අයදුම් පත් 1973 මාර්තු මස 01 වැනි දිනට පෙර, මුදල් අමාත්‍යාංශයේ ලේකම් (මධ්‍යම ශාඛාව), තැ. පෙ. 500, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "සහකාර අධ්‍යක්ෂ, සංස්ථා අංශය" යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

**සටහන.**—ඉල්ලුම් පත්‍රය තැපැලේදී නැතිවූ බවට හෝ, ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලීමට නොපිළිවන. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගනු ලැබිය යුතුය.

2. **වැටුප් හා දීමනා.**—ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත පදනමක් පිට, විවාහක දීමනාවද සමග, වර්ෂයකට රුපියල් **11,040—11 × 480—රු. 16,320** වැටුපක්.

(තෝරාගනු ලැබූ අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඔහු වැටුප් පරිමාණයේ පියවරක තැබිය හැකිය).

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම—

(අ) ඔහු/ඇය විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්තව සිටින බවට ද;

(ආ) 1972 සැප්තැම්බර් 11 වැනි දිනට වයස අවුරුදු 23 ට නොඅඩු හා අවුරුදු 35 ට වැඩි නොවන බවටද, සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතුය.

(දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයදුම් කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපානු ඇත).

(ඇ) **අධ්‍යාපන සුදුසුකම්:**

(i) ලංකාවේ/එංගලන්තයේ/වේල්සයේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම; හෝ

(ii) එංගලන්තයේ පිරිවැය හා වැඩ පිළිබඳ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වීම.

රජයේ දෙපාර්තමේන්තුවක හෝ වාණිජය හෝ කාර්මික ආයතනයක පහත සඳහන් ක්ෂේත්‍රයන් ඇතුළත් වන විධායක ශ්‍රේණියක පළපුරුද්ද තනතුර සඳහා සුදුසු වූවායින් පසු ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

(අ) මුදල් පරිපාලනය, විමර්ශනය හා කළමනාකාරිත්වය;

(ආ) ගණන් තැබීම, පිරිවැය තැබීම හා කළමනාකාරිත්වය පිළිබඳ සවිස්තර ක්‍රම සම්පාදනය;

(ඇ) යෝජනා ක්‍රම සමාලෝචනය කිරිම හා මිල නියම කිරීම.

4. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම, ඉල්ලා සිටි විටක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (අධ්‍යාපන රෙගුලාසි සංග්‍රහයේ ප්‍රකාර උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරනු ලබන උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.) ;

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය ;

(ඇ) වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඈ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් විභාග පිළිබඳ සහතික.

**සටහන.**—(i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිට පතක් හෝ ඇමිණිය යුතු නැත.

(ii) ඉල්ලා සිටි විටෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

5. රාජ්‍ය සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර, තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතුය.

6. ඉල්ලුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියකියවිල්ලක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

7. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඒ කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ, ගාලු මුවදොර,
මහලේකම් කාර්යාලයේ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

### ඉල්ලුම් පත්‍ර ආකෘතිය

1. ඉල්ලුම් කරන තනතුර :————.
2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
3. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය) :————.
4. උපන් දිනය : වර්ෂය :——, මාසය :——. දිනය :——.
5. ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස : වර්ෂය :——. මාස :——. දින :——.
6. ඔබ ලංකා පුරවැසියෙක් ද ? පාරම්පරික රටවැසියෙක් ද, එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද, යන බව සඳහන් කරන්න. (සටහන අංක (1) බලන්න) :————.
7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න) :
   (අ) ඉල්ලුම්කරුගේ :————.
   (ආ) පියාගේ :————.
   (ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
   (ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවකද යන බව :————.
9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :
   (1) සිංහල :————.
   (2) දෙමළ :————.
   (3) ඉංග්‍රීසි :————.
10. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම, උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.
11. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් (රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න :—

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| ...................... | ............... | .................... | .................... |
| ...................... | ............... | .................... | .................... |
| ...................... | ............... | .................... | .................... |
| ...................... | ............... | .................... | .................... |
| ...................... | ............... | .................... | .................... |
| ...................... | ............... | .................... | .................... |

**සැලකිය යුතුයි.**—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 13 කොටුවෙහි සඳහන් කළ යුතුය.

12. විශේෂ සුදුසුකම් : (දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේ ද ? එසේ ඇතහොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න) :————.
13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.
14. මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2–352—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ බටහිර, දෙනියස්පේ කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ බටහිර, දෙනියස්පේ හදිසි මරණ පරීක්ෂ ධුරය සඳහා කොටගල, සියඹලාගොඩ නැගෙනහිර, සියඹලාගොඩ බටහිර, දංකොලුව, දෙනියස්පෙ, පිටබැද්දර, ඇරංගල හා ගොරකවෙල යන ග්‍රාම සේවක කොට්ඨාශවල ස්ථිර පදිංචිය ඇත්තාවූ පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කරමි. මේ සඳහා මෙම කාර්යාලයෙන් හෝ කොටපොල, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයෙන් හෝ නිකුත්කරනු ලබන අයදුම්පත්වල ඉල්ලා ඇති විස්තර නිසි අයුරු සම්පූර්ණකර අදාල සහතිකවල පිටපත් ද සමග 1973 පෙබරවාරි මස 24 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචිකල තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් ලැබුණුබව දන්වා එවනු නොලැබේ.

1. ලිපිනය.—දිසාපති, දිසාපති කාර්යාලය, මාතර.

2. **සුදුසුකම් :—**

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර ශක්තියකින් යුක්තවීම.

(ඇ) අයදුම්කරු ඉහතකී කොට්ඨාශයන්හි ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඈ) 1925 හා 1944 අතරතුර කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ; **නැතහොත්**

සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත්වීම.

(ඉ) රජයේ, සංස්ථා හෝ පලාත් පාලන ආයතනයක සේවකයින් නොවිය යුතුය.

(ඊ) පලාත් පාලන ආයතනවල නියෝජිතයින් නොවිය යුතුය.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුනා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක් (මින් එකක් පලාතේ ග්‍රාම සේවකගෙන් විය යුතුය.)

(ඈ) කොට්ඨාශයේ ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම සේවකගේ සහතිකය (මෙය කොටපොල ප්‍රාදේශීය ආදායම් නිලධාරි මගින් ග්‍රාම සේවකට එවිය හැකිය.)

4. මීට අමතරව තම අයදුම් පත සමග එම අයදුම්පතේ සඳහන් කරුණු සත්‍යබවටත්, තමා ණයගැති නොවන බවටත් දිව්රුම් සහතිකයක් අමුනා එවිය යුතුය.

5. සැම අයදුම්කරුවෙක්ම ඔහුගේ අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කල යුතුය.

6. අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට සිදුවිය හැක. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීමක් හෝ කරනු නොලැබේ.

ගාමිනී කරුණාරත්න,
මාතර දිසාපති.

1973 ජනවාරි මස 12 වැනි දින,
මාතර දිසාපති කාර්යාලයේදී ය.

2–292—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### තාවකාලික වෙළඳ සහායක/සහායිකා තනතුරු

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික වෙළඳ සහායක/සහායිකා තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් පහත සඳහන් ආකෘතියට අනුව පිළියෙල කර 1973. 02. 28 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

2. **වැටුප් පරිමාණය :—**

මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය පළමුවැනි 6 මාසය තුළ දිනකට රු. 7.40 බැගින් සහ ඉන් පසුව වර්ෂයකට රු. 2,760—60 × 13—3,540 වේ.

3. මෙම තනතුර තාවකාලික ය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගන්නා අපේක්ෂකයා රජයේ සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—**

(අ) ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටීම.

(ආ) හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතු ය.

**සටහන :**

(අ) රජයේ හෝ පෞද්ගලික ආයතනයක දී හෝ වෙළඳ සහායක සහායිකාවක ලෙස ලබා ඇති පළපුරුද්දක් ඇත්නම් ඒ ගැනද,

(ආ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳව මනා දැනීමක් ඇත්නම් ඒ ගැනද,

(ඇ) ප්‍රංශ සහ ජර්මන් භාෂා පිළිබඳ දැනීමක් ඇත්නම් ඒ ගැනද, වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. සෑම අයදුම්කරුවකු විසින් ම තමා පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(අ) **විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.**

(ආ) 1973 පෙබරවාරි මස 28 දිනට වයස අවුරුදු 18 ට නො අඩු විය යුතු ය. අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

6. අයදුම්කරුවන්, පහත සඳහන් **ලියකියවිලි එකක් හෝ සියල්ලම** අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතු ය.

(අ) උප්පන්න සහතිකය (සැ. යු.—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම සහතික භාර ගනු නොලැබේ.)

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස් ම විභාගය පිළිබඳ සහතිකය.

**සංලක්ෂ්‍යය :**

(i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිට පතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් ගැන සලකා බලනු නො ලැබේ.

7. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත් නම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

8. අයදුම්කරුවන් ස්වකීය වියදමින් ම කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතු ය.

9. අයදුම් පතේ ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරා ගනු ලැබීමට ප්‍රථම සොයා ගතහොත් අයදුම්කරුවන් නුසුදුස්සන් කිරීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු සොයා ගතහොත් සේවයෙන් පහකිරීමට ද සිදු වනු ඇත.

10. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) වන **ඡේදයේ ආරම්භ** යෙහි සඳහන් වන්නාවූද, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූද, කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,<br>
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (කළමනාකාරිත්ව),<br>
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජනවාරි 31 වැනි දින,<br>
කුඩාකර්මාන්ත දෙපාර්තමේන්තුව,<br>
හේමාස් ගොඩනැගිල්ල,<br>
කොළඹ 1.

### තාවකාලික වෙළඳ සහායක/සහායිකා තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "තාවකාලික වෙළඳ සහායක/ සහායික තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපැලෙන් කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය.)

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතු යි.)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ පාඨමාලා පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9. **යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදි කරු** වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. **චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි** නාම :—

(1) ————.<br>
(2) ————.<br>
(3) ————.

————,<br>
අත්සන.

දිනය :————.

2-327—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

### මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ බටහිර, මොරවක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ බටහිර, මොරවක හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා වරල්ල, මොරවක, වැලිව, රඹුකන, අලපලාදෙනිය, බානගල හා කලුබෝවිටියන යන ග්‍රාම සේවක කොට්ඨාශවල ස්ථිර පදිංචිය ඇත්තාවූ පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කරමි. මේ සඳහා මෙම කාර්යාලයෙන් හෝ කොටපොල, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයෙන් හෝ නිකුත් කරනු ලබන අයදුම්පත්වල ඉල්ලා ඇති විස්තර නිසිඅයුරු සම්පූර්ණ කර අදාල සහතිකවල පිටපත්ද සමග 1973 පෙබරවාරි මස 24 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත් ලැබුණුබව දන්වා එවනු නොලැබේ.

1. **ලිපිනය.**—දිසාපති, දිසාපති කාර්යාලය, මාතර.

2. **සුදුසුකම් :—**

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහතකී කොට්ඨාශයන්හි ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඈ) 1925 හා 1944 අතරතුර කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්

**නැතහොත්**

සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත් වීම.

(ඉ) රජයේ, සංස්ථා, පළාත් පාලන ආයතනයක සේවකයින් නොවිය යුතුය.

(ඊ) පළාත් පාලන ආයතනවල නියෝජිතයින් නොවිය යුතුය.

**3.** අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල **පිටපත්** අමුනා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක් (මින් එකක් පළාතේ ග්‍රාම සේවකගෙන් විය යුතුය.)

(ඈ) කොට්ඨාශයේ ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම සේවකගේ සහතිකය (මෙය කොටපොල ප්‍රාදේශීය ආදායම් නිලධාරි මගින් ග්‍රාම සේවකට එවිය හැකිය.)

4. මීට අමතරව තම අයදුම්පත සමග එම අයදුම්පතේ සඳහන් කරුණු සත්‍යබවටත්, තමා ණයගැති නොවන බවටත් දිවුරුම් සහතිකයක් අමුණා එවිය යුතුය.

5. සෑම අයදුම්කරුවෙක්ම ඔහුගේ අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

6. අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනීසිටීමට සිදුවිය හැක. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීමක් හෝ කරනු නොලැබේ.

ගාවින් කරුණාරත්න,
මාතර දිසාපති.

1973 ජනවාරි මස 17 වැනි දින,
මාතර, දිසාපති කාර්යාලයේදිය.

2–254—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ බටහිර මිදිගම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ බටහිර, මිදිගම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා මිදිගම බටහිර, මිදිගම නැගෙනහිර හා ඉබ්බාවල යන ග්‍රාම සේවක කොට්ඨාශවල ස්ථිර පදිංචිය ඇත්තාවූ පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කරමි. මේ සඳහා මෙම කාර්යාලයෙන් හෝ වැලිගම, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයෙන් හෝ නිකුත්කරනු ලබන අයදුම්පත්වල ඉල්ලා ඇති විස්තර නිසි අයුරු සම්පූර්ණ කර අදාල සහතිකවල පිටපත් ද සමග 1973 පෙබරවාරි මස 24 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත් ලැබුණුබව දන්වා එවනු නොලැබේ.

1. **ලිපිනය.**—දිසාපති, දිසාපති කාර්යාලය, මාතර.

2. **සුදුසුකම් :—**

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්කරු ඉහතකී කොට්ඨාශයෙහි ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඈ) 1925 හා 1944 අතරතුර කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්

**නැතහොත්**

සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත්වීම.

(ඉ) රජයේ, සංස්ථා හෝ පළාත් පාලන ආයතනයක සේවකයින් නොවිය යුතුය.

(ඊ) පළාත් පාලන ආයතනවල නියෝජිතයින් නොවිය යුතුය.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල **පිටපත්** අමුනා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක් (මින් එකක් පළාතේ ග්‍රාම සේවකගෙන් විය යුතුය.)

(ඈ) කොට්ඨාශයේ ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම සේවකගේ සහතිකය. (මෙය වැලිගම, ප්‍රාදේශීය ආදායම් නිලධාරි මගින් ග්‍රාම සේවකට එවිය හැකිය.)

4. මීට අමතරව තම අයදුම්පත සමග එම අයදුම්පතේ සඳහන් කරුණු සත්‍යබවටත්, තමා ණයගැති නොවන බවටත් දිවුරුම් සහතිකයක් එවිය යුතුය.

5. සෑම අයදුම්කරුවෙක්ම ඔහුගේ අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

6. අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනීසිටීමට සිදුවිය හැක. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීමක් හෝ කරනු නොලැබේ.

ගාවින් කරුණාරත්න,
මාතර දිසාපති.

1973 ජනවාරි මස 17 වැනි දින,
මාතර, දිසාපති කාර්යාලයේදිය.

2–255—73.02 09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

සහකාර අධ්‍යක්ෂ තනතුර

ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1973. 02. 28 දිනට හෝ ඊට පෙර "ලේකම්, නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශය, 54, චැතැම් වීදිය, කොළඹ 1" වෙත ලේඛණගත තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. කවරේ වම් කෙලවරේ "සහකාර අධ්‍යක්ෂ තනතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(අ) තනතුර ස්ථිරය, රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) සත්වෝද්‍යානය තුල නිල නිවාසයක් වෙන්කර දුන් පසුව, තෝරා ගනු ලබන තැනැත්තා එහි පදිංචි විය යුතු අතර, ඕනෑම අවස්ථාවක සේවය සඳහා සූදානම්ව සිටිය යුතුය. මුදල් රෙගුලාසි අනුව ඔහු විසින් ගෙවල් කුලී ගෙවිය යුතුය.

3. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 6720 න් පටන් ගෙන රු. 360 වාර්ෂික වැටුප් වර්ධක 12 කින් හා වර්ෂයකට රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධක 5 කින් වර්ෂයකට රු. 13,440 දක්වා **වැඩිවන ඒකාබද්ධ** වැටුපක් මේ තනතුරට අයිතිය. (69. 10. 1 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 4080—12×360 සහ 5×480—10,800 වේ) වර්ෂයකට රු. 11,040 ඒකාබද්ධ වැටුප් පියවර ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව,

(ආ) 1973. 02. 28 දිනට වයස අවුරුදු 22ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි බව,

(දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට උපරිම වයස් සීමාව බලපවත්වන්නේ නැත.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් සත්ව විද්‍යාව ගෞරව උපාධියක් ලබා ඇති බව, **එසේ නැතහොත්** රසායන විද්‍යාව, සත්ව විද්‍යාව හා උද්භිද විද්‍යාව යන විෂයයන් සහිතව සාමාන්‍ය උපාධියක් ලබා ඇති බව,

**සටහන.**—සාමාන්‍ය පරිපාලන හා සැකසුම් හැකියාවක් ද, ක්ෂෙත්‍ර රාජකාරි හා පර්යේෂණ කටයුතු කෙරෙහි ඇල්මක් හා උනන්දුවක් දක්වන අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. ඉල්ලුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් **පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.**

(i) උප්පැන්න සහතිකය.

(ii) මෑතකදී ලබා ගත් චරිත සහතික 3 ක් (රජයේ සේවයේ යෙදී සිටින අයට අදාල නොවේ).

(iii) උසස්ම අධ්‍යාපනික/සහ වෘත්තිය සහතික.

(iv) සාමාන්‍ය පරිපාලනය, සැකසුම් හැකියාව සහ ක්ෂෙත්‍ර රාජකාරි හා පර්යේෂණ කටයුතු සම්බන්ධයෙන් අයදුම්කරුගේ පළපුරුදුකම් පිළිබඳ විස්තර සඳහන් වන අත්සන් කරන ලද වාර්තාවක් සමග එම විස්තර තහවුරු කරන සහතිකවල පිටපත්.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ වූ ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාර ගනු ලැබේ.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ වෙනයම් ලියකියවිලි නැව් කටයුතු හා සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ට හැර, මෙම අමාත්‍යාංශයේ හෝ සත්වෝද්‍යානයේ දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවල කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ඇත.

පී. බී. කරඳවල,
ලේකම්,
නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශය.

1973 ජනවාරි මස 29 වැනිදා,
කොළඹ 1, චැතැම් වීදියේ නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ දීය.

**ආදර්ශ ආකෘතිය**

දෙහිවල ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය.

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද යන බව :————.
6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුසුදුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
7. පාඨශාලාවෙන් අස් වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
   (මේ සම්බන්ධයෙන් ලත් සහතිකවල පිටපත් අයදුම්පතට යා කළ යුතුය.)
8. මීට කලින් ආඩුණ්වේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතු.
9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරුවකු වී ඇත්නම්, එම වරද හා දඬුවම පිළිබඳ විස්තර :————.
10. චරිත සහතිකය දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි නාම :————.

මේ අයදුම්පතෙහි මා විසින් සඳහන් කරනලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–351—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

**දන්ත වෛද්‍ය නිලධාරි තනතුර**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ දන්ත වෛද්‍ය නිලධාරියෙකුගේ තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**2. තෝරා ගන්නා ලද අපේක්ෂකයාට වෛද්‍ය ලුතිනන් (ද) කෙනෙකු වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය අධිකාරියක් ලැබෙනවා ඇත.**

3. (අ) **වැටුප්.**—දන්ත වෛද්‍ය නිලධාරියකුගේ වැටුප් පරිමාණය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ දන්ත වෛද්‍ය නිලධාරීන්ට අදාළ පරිමාණයන් වේ.

(ආ) පහත සඳහන් දීමනා ද ගෙවනු ඇත :—

(i) **සේවා දීමනා**—ලුතිනන් සහ ලුතිනන් කොමාන්ඩර් වරයෙකුට මසකට රු. 180 බැගින්, කොමාන්ඩර්වරයෙකුට රු. 225 බැගින ;

(ii) නාවික හමුදා වැටුප් සංග්‍රහයේ ප්‍රතිපාදන සලසා ඇති අයුරින් සුදුසුකම් වැටුප් ගෙවනු ලැබේ;

(iii) පහත සඳහන් අයුරින් නිල ඇඳුම් සඳහා දීමනා ගෙවනු ලැබේ. පළමුවෙන් සර්ම කලාපීය නිල ඇඳුම් සඳහා රු. 1,000 කි. ඉන් පසු පත් කළ දින සිට නිල ඇඳුම් නඩත්තු දීමනාව වශයෙන් මසකට රු. 25 ක මුදලක් ගෙවනු ලැබේ;

(iv) රජයේ ගණන් හිමි අනුව විවාහක දීමනාව ගෙවනු ලැබේ.

4. තෝරා ගන්නා ලද අපේක්ෂකයා විවාහකයෙක් නම්, විවාහක නිවාසයක් (ලබාදිය හැකිනම්) සහ අනුගාමික සේවය සඳහා මසකට රු. 75 ක දීමනාවකට ද හිමිකරුවකු වේ. අවිවාහක නම් සේවක සේව යද සහිතව නිලධාරි නිවාසයේ ඉඳුම් හිටුම් ලැබීමට සුදුස්සෙක් වේ.

5. (i) තෝරාගනු ලබන අපේක්ෂකයා අධිකාරියට පත් කිරීමට ප්‍රථම දින වන තෙක් විශ්‍රාම වැටුප් හිමි රජයේ තනතුරක් දරමින් සිටියේ නම්, කලින් කල ගැසට් පත්‍රයේ දැන්වීම් පළකර, සංශෝධනය කර ඇති 1934 පෙබරවාරි මස 5 දින දරණ විශ්‍රාම වැටුප් සංග්‍රහයේ සටහන් සහ කොන්දේසි යටතේ සහ ඒ අනුව විශ්‍රාම වැටුප් හිමිවේ.

(ii) ඉහත 5 (i) ඡේදයට ඇතුළත් නොවන අපේක්ෂකයකු නම් ඔහු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් නොලබන නමුත්, 1972 ජනවාරි 10 දින අංක 3 දරණ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍ර ලේඛනයේ සඳහන් පරිදි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වේ.

(iii) සේවා කොන්දේසි, උසස්වීම් ආදිය ගැන වැඩිදුර විස්තර කොළඹ නාවික හමුදා මූලස්ථානයේ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි වේ.

6. අයැදුම්කරුවන් **විසින් මෙහි පහත සඳහන් කොන්දේසි සපුරා** ලිය යුතුයි :—

(අ) **ජාතිය—අයැදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි;**

(ආ) **වයස—අයැදුම්කරුවන් 1973 මාර්තු 15 වැනි දිනට වයස අවුරුදු 32 ට වැඩි නොවිය යුතුයි;**

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම්—අයැදුම්කරුවන් ඇල්. ඩී. ඇස්., බී. ඩී. ඇස්. උපාධි හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පරීක්ෂණ මණ්ඩලයකින් ඊට වඩා උසස් සුදුසුකම් ලබා සිටිය යුතු අතර, වැඩිමනත්ව දන්ත වෛද්‍යවරයෙකු ලෙස ල කා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචි වූවකු විය යුතුය.**

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය**—අයැදුම්කරුවන් නාවික හමුදාවේ නියම කර ඇති පරිදි සෞඛ්‍ය තත්ත්වයට ගැලපෙන අයුරින් සිටිය යුතුයි. පත්වීම් ලැබීමට මත්තෙන් නාවික හමුදාව විසින් පිළියෙල කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

7. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව අයැදුම්පත් අත් අකුරින් ලියා 1973 මාර්තු 15 වැනි දිනට පෙර නාවික හමුදාධිපති, නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ වෙත එවිය යුතුයි. අයැදුම්පත බහා එවන කවරයේ "දන්ත වෛද්‍ය නිලධාරි තනතුර සඳහා අයැදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයැදුම්පත් ලැබුණු බව් දන්වනු ලැබේ.

8. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් එවන අයැදුම්පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. තෝරා ගනු ලැබුවහොත් එම නිලධාරියා නිදහස් කළ හැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතුයි.

9. අයැදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහ වෘත්තිය සහතිකය.

(ඇ) අයැදුම්කරු පෞද්ගලිකව හඳුනන වගකිවයුතු පුද්ගලයින් ගෙන් ලබාගත් යටත් පිරිසෙයින් චරිත සහතික දෙකක්.

10. ලැබෙන අයැදුම්පත් ගණන අනුව අවශ්‍ය වුවහොත්, ප්‍රථමයෙන් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගන්නවා ඇත. අවසාන තෝරා ගැනීම කරනු ලබන්නේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් මෙම අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය.

11. සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබූ අයැදුම්කරුවන්ට, සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පවත්වනවා ඇත. මේ සඳහා අයැදුම්කරුවන්ට දැරීමට සිදුවෙන ගමන් වියදම් හෝ වෙනත් අන්දමේ වියදම් සඳහා ශ්‍රී ලංකාණ්ඩුවෙන් මුදල් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනු නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වනවා ඇත.

12. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

ඩී. වී. හන්ටර්,
කොමදෝරු, නාවික හමුදාධිපති.

1973 පෙබරවාරි 1 වැනි දින,
මූලස්ථානය, ශ්‍රී ලංකා නාවික හමුදාව,
තැ. පෙ. 593, කොළඹ 1.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

දන්ත වෛද්‍ය නිලධාරියකු සඳහා අයැදුම්පත

1 සම්පූර්න නම (පැහැදිලි අකුරින්) :————.

2. ජාතිය—(ලංකාවේ පුරවැසියකු නම්, උත්පත්තියෙන් ද නැත හොත් ලියාපදිංචි කරනු ලැබීමෙන් ද යන වග සඳහන් කරන්න. ලියාපදිංචි කරනු ලැබුවෙකු නම් ලියාපදිංචි අංකය සහ දිනය සඳහන් කරන්න) :————.

3. ලිපිනය :—
රාජකාරි :————.
පෞද්ගලික :————.

4. උපන් දිනය :————.

5. පහත සඳහන් පරිදි මව්පියන්ගේ විස්තර :—

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

6. විවාහක ද අවිවාහක ද යන වග :————.

7. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී හෝ ඔබ ලබා ඇති ක්‍රීඩා පිළිබඳ දක්ෂකම් :————.

8. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී හෝ ලබාගත් විශේෂ සුදුසුකම් :————.

9. මිට පෙර සන්නද්ධ සේවයක, ස්වේච්ඡා භට කණ්ඩායමක, ශිෂ්‍ය භට කණ්ඩායමක හෝ බාලදක්ෂ සංවිධානයක සේවය කර තිබේද :————.

10. මෙම තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

11. මිට පෙර සන්නද්ධ සේවාවක පුරප්පාඩුවක් සඳහා ඉල්ලුම් කර තිබේද ? එසේ නම් එහි ප්‍රතිඵල :————.

12. ඔබේ පාසැලේ දී සහ විශ්ව විද්‍යාලයේ හෝ චරියාව පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| පාසැලේ සහ විශ්ව විද්‍යාලයේ නම | දිනය | | සමර්ථ වූ ආණ්ඩුවේ පරීක්ෂණ |
|---|---|---|---|
| | ඇතුල්වීම | පිටවීම | |
| | | | |

13. විශ්ව විද්‍යාල්ය හැරයාමෙන් පසුව නියුක්තව සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම | රැකියාවෙහි ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

14. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–294—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකම් දෙපාර්තමේන්තුව**

ප්‍රායෝගික ගොවි පාසැල්—පුහුණු වීමේ වෂීය 1973-74

පහත සඳහන් ගොවි පාසැල්හි 1973-74 පුහුණුවීමේ වර්ෂය 1973 මැයි මස 2 වෙනි දිනයෙන් ආරම්භ වේ. ඉල්ලුම් කරුවන් විසින් තම තමන් පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කෘෂිකම් ව්‍යාප්ති නිලධාරි වෙත 1973 මාර්තු මස 5 දිනට ප්‍රථම ඉල්ලුම්පත් යැවිය යුතුය.

ගොවි පාසැල්වල පුහුණුවීමේ පාඨමාලාව වෘත්තියක් වශයෙන් ගොවිතැනට බැසීමට තීරණය කර ඇති තරුණ තරුණියන් උදෙසා අදහස් කරනු ලබන්නකි. පුහුණුව අවසන් කළ පසු ඔවුනට රක්ෂා සැපයීමට ලංකාණ්ඩුව බැඳී නොමැති බවත්, රැකියා බලාපොරොත්තු වෙන් මෙම පාඨමාලාවට ඇතුලත් නොවිය යුතු බවත් අපේක්ෂකයින් විසින් මැනවින් තේරුම් ගත යුතුය.

ඉල්ලුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුවේ :—

(i) 1973 මැයි 2 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 17 ත් 24 ටත් අතර විය යුතුය.

(ii) ඔවුන් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුළු විෂයයන් හයකින් වත් (6) සමත්වී සිටිය යුතුවේ.

(iii) ඉල්ලුම්කරුවන් අවිවාහක විය යුතුය.

අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී කෘෂිකම්යෙන් සහ වෙනත් විද්‍යා විෂයයන්ගෙන් සමත්වූ අයට, තරුණ ගොවි සමාජවල ක්‍රියාකාරී සාමාජික/සාමාජිකාවන්ට සහ පුහුණුව අවසන් කළ විගස ගොවිතැනෙහි යෙදීමට හැකියාවක් ඇති අයට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ. තරුණ ගොවි සාමාජිකයින් විසින් තම පළාතේ කෘෂිකම් උපදේශක සහතික කළ ප්‍රක්ෂෙප සටහන් පොත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

මෙම නිවේදනය අන්තයේ දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කරගත් ඉල්ලුම්පත්‍ර ඉල්ලුම්කරුවන් තමන් පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කෘෂිකම් ව්‍යාප්ති නිලධාරි වෙත 1973 මාර්තු මස 5 වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ යැවිය යුතුය.

| පාසැල පිහිටි ස්ථානය | | | ඉගැන්වීමේ මාධ්‍යය |
|---|---|---|---|
| **පිරිමි පාසැල් :** | | | |
| 1. පැල්වැහැර | ... | ... | සිංහල |
| 2. අඹේපුස්ස | ... | ... | සිංහල |
| 3. වාරියපොල | ... | ... | සිංහල |
| 4. බිබිල | ... | ... | සිංහල |
| 5. කිලිනොච්චිය | ... | ... | දෙමළ |
| 6. වව්නියා | ... | ... | දෙමළ |
| **ගැහැණු පාසැල් :** | | | |
| 1. වල්පිට | ... | ... | සිංහල |
| 2. තින්නවේලි | ... | ... | දෙමළ |

තෝරාගත් අයදුම් කරුවන් තමා පදිංචි ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික හා දේශගුණික පරිසරයන්ට සමාන කලාපයක පිහිටි

ගොවි පාසැලකට ඇතුළත් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ. තෝරාගනු ලබන සිංහල අයදුම්කාරියන් වල්පිට ගොවි පාසැලටත්, දෙමළ අයදුම්කාරියන් තින්නවේලි ගොවි පාසැලටත් ඇතුලු කෙරේ.

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

1973 ජනවාරි මස 29 දින,
පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

### ආකෘති ඉල්ලුම් පත්‍රය

1973/74 වර්ෂය සඳහා—පිරිමි/ගැහැණු ප්‍රායෝගික ගොවි පාසැලට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් පත්‍රයයි

1. (i) අයදුම්කරුගේ නම සහ ලිපිනය :————.
   (ii) අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කය :————
2. (i) උපන් දිනය :————.
   (ii) 1973.5.2 වන දිනට වයස :— අවුරුදු :——. මාස :——.
3. (i) පියාගේ හෝ භාරකරුගේ හෝ නම සහ ලිපිනය :————.
   (ii) පියාගේ හෝ භාරකරුගේ රක්ෂාව :————.
4. අයදුම්කරුගේ පියාට හෝ භාරකරුට හෝ අයිති ඉඩම් පිළිබඳ විස්තරය :————.

| | ප්‍රමාණය | වගාකර ඇති බෝග |
|---|---|---|
| (i) ගොඩ ඉඩම් ... | ............ | .................. |
| (ii) වාරිමාර්ග යටතේ වගා කළ හැකි ඉඩම් ... | ............ | .................. |

(ඉඩම් අයිතිය ගැන ග්‍රාමසේවකගේ සහතිකයක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.)

5. අයදුම්කරුගේ සහෝදරියන් හෝ සහෝදරයින් ගණන :————.
6. අවසාන වරට සාමාර්ථය ලැබූ විභාගය :————.
7. විභාගයෙන් සාමාර්ථය ලත් විෂයයන් :—
   (i)........................ (v)........................
   (ii)........................ (vi)........................
   (iii)........................ (vii)........................
   (iv)........................ (viii)........................
8. අවසන් වරට ඉගෙනුම ලැබූ පාසැල :————.
9. පාසැලේදී ඔබ සහභාගිවූ ක්‍රීඩා යනාදිය :————.
   (අවසානට ඉගෙනුම ලැබූ පාඨශාලාවේ ප්‍රධානාචාර්ය තුමාගෙන් ලත් චරිත සහ වෙනත් සහතික දෙකක පිටපත් අමුනන්න.)
10. ඔබ තරුණ ගොවි සමාජයක සාමාජිකයෙක්/සාමාජිකාවක් ද? එසේ නම් සමිතියේ නම, ලියාපදිංචි අංකය සහ ලිපිනය සඳහන් කරන්න :————.
11. තරුණ ගොවි සමාජ කටයුතුවලට ඔබ සහභාගිවුනි නම් එහි විස්තර :————
12. ගොවිතැන් පිළිබඳ ඔබේ පළපුරුද්දක් තිබේද? :————.
13. කෘෂිකර්මය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීමට ඔබට ඇති වෙනත් සුදුසුකම් :————.

ඉහතින් සඳහන් කර ඇති කරුණු මා දන්නා තරමට නිවැරදි බවත් සත්‍ය බවත් මම සහතික කරමි.

....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2-347—73.02.09 දින අංක 46 දරන ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

1974 වර්ෂයේ මරදානේ ලංකා කාර්මික විද්‍යාලයට ද, අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට ද, ගාල්ල, යාපනය, දෙහිවල සහ මහනුවර බහු තාක්ෂණික ආයතනවලට ද, රත්මලාන, කුරුණෑගල, අනුරාධපුරය, කෑගල්ල සහ බදුල්ල කණිෂ්ඨ කාර්මික ආයතනවලට ද, ඇතුළත්වීම සඳහා පවත්වන විභාගය පිළිබඳ ව්‍යවස්ථා—

මෙම ව්‍යවස්ථා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහභාගිත්වය ඇතිව සකස් කර තිබෙන අතර මෙම විභාගය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් විභාග කොමසාරිස්වරයා විසින් පවත්වනු ලැබේ.

(අ) පවත්වනු ලබන පාඨමාලා පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් සඳහා ද, පාඨමාලාවල විෂයමාලා සම්බන්ධ විස්තර සඳහා ද එම ආයතනයට ඇතුළත්වීම පිළිබඳව ලංකා කාර්මික විද්‍යාලයය මගින් නිකුත් කර ඇති අත් පොත් බැලිය යුතු අතර, අනිකුත් සියලුම අවස්ථා සම්බන්ධයෙන් ඒ ඒ ආයතනවල විද්‍යාලයාධිපතිවරුන්ගෙන් විමසිය යුතුවේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් නොවන පාඨමාලා නොපැවැත්වීමට ඉඩ තිබේ.

(ආ) ඇතුළත්වීම සඳහා වන යෝග්‍යතා කොන්දේසි පාඨමාලාවෙන් පාඨමාලාවට වෙනස් වේ.

(ඉ) තෝරාගනු ලබන ඒ ඒ පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන්නේ නම් විභාගාපේක්ෂකයෙකුට එක් පාඨමාලාවකට වැඩි ගණනකට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කළ හැකිය. පාඨමාලා එකකට වැඩි ගණනකට ඇතුළත්වීම සඳහා ඔහු සුදුසුකම් ලබා සිටින්නේ නම් එක්තරා පාඨමාලාවක් හෝ පාඨමාලා හෝ අපේක්ෂකයා විසින් අනුගමනය කළ යුතු යයි අවසාන වශයෙන් තීරණය කිරීමේ අයිතිය සතු අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයට යටත්ව කැමති පාඨමාලාව තෝරා ගත හැකිය.

(ඊ) අර්ධකාලීන පාඨමාලාවක් සඳහා ඇතුළත්වීම එම ක්ෂෙත්‍රයේ රැකියාවෙහි නියුක්ත අය සඳහා සීමා කරනු ලැබේ. එම අර්ධකාලීන පාඨමාලා සඳහා පහත සඳහන් ආකාරයට ගාස්තු අයකරනු ලැබේ :—

(1) වෘත්තීය පාඨමාලා සඳහා මසකට රු. 15 බැගින් ද,
(2) කාර්මික මට්ටමේ පාඨමාලා සඳහා මසකට රු. 10 බැගින් ද,
(3) ශිල්පීය මට්ටමේ පාඨමාලා සඳහා මසකට රු. 5 බැගින් ද වේ.

(උ) කවර හෝ ආයතනයක ප්‍රාරම්භක ඉංජිනේරු විද්‍යා විභාගයකින් සාමාර්ථය ලැබ වෙනත් ආයතනයක සන්ධ්‍යා ඉංජිනේරු පාඨමාලාවක් සඳහා ඇතුළත්වීමට ඉල්ලුම් කරන ශිෂ්‍යයන් විසින් එම පාඨමාලාව සඳහා නියමිත ප්‍රවේශ විභාගයට පෙනී සිටීම අවශ්‍ය වේ.

2. විභාග මධ්‍යස්ථාන.—(i) විභාගය පහත දැක්වෙන නගරයන්හි පවත්වනු ලැබේ :—

කොළඹ, මඩකලපුව, කෑගල්ල, රත්නපුරය, මහනුවර, ගාල්ල, යාපනය, කුරුණෑගල, බදුල්ල, අනුරාධපුරය, කළුතර, මාතර, මීගමුව, ගම්පහ සහ නුවරඑළිය.

(ii) විභාගාපේක්ෂකයන් විසින් එක මධ්‍යස්ථානයක් පමණක් නම් කළ යුතුය.

(iii) විභාගාපේක්ෂකයෙකු විසින් තෝරා ගන්නා ලද මධ්‍යස්ථානයක් වෙනස් කිරීමට අවසර දෙනු නො ලැබේ.

3. ප්‍රවේශ විභාගයට පෙනී සිටීමේ යෝග්‍යතාව : විභාගාපේක්ෂකයෙකු.—(i) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) ලංකා පුරවැසියෙකු විය යුතුය.

(iii) විභාගය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඇතුළත්වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ලබා සිටිය යුතුය. මෙම රෙගුලාසි අවසානයේ ඇති වක්‍රයේ, ඒ ඒ පාඨමාලාවලට අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් සඳහන් කර ඇත.

සැලකිය යුතුයි.—(i) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යමය පාඨමාලාවල මාධ්‍ය අනුව ඇතුළත්වීමේ යෝග්‍යතා කොන්දේසි වෙනස් විය හැකිය.

(ii) ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක් අවශ්‍ය ස්ථානයන්හි අ. පො. ස. (සා.පෙ.) විභාගයේ " ඒ " හෝ " බී " නිර්දේශයෙන් සාමාර්ථයක් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා (ඉංග්‍රීසි) සහතිකය හෝ බාරගනු ලැබේ.

(iii) ගණිතය යන විෂයයෙන් සාමාර්ථයක් අවශ්‍ය ස්ථානයන්හි මූලික ගණිතයෙන් හෝ ශුද්ධ ගණිතයෙන් ලත් සාමාර්ථයක් පිළිගනු ලැබේ.

(iv) යම් විභාගාපේක්ෂකයෙකු විසින් අ. පො. ස. (සා.පෙ.) විභාගයේදී සාමාර්ථය ලබා තිබිය යුතු කිසියම් විෂයයක් අ. පො. ස. (උ.පෙ.) විභාගයේදී සාමාර්ථය ලබා තිබුනොත් ඔහු එම විෂයයෙන් නිදහස් කළ හැකිය.

4. **වයස් සීමාව.**—වයස් සීමාව පිළිබඳ විස්තර එක් එක් පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් යටතේ දැක්වේ.

5. **ලිඛිත විභාගය පැවැත්වෙන දින.**—මෙම විභාගය 1973 මැයි මස 25 වැනි දින ආරම්භ වේ.

6. **සම්මුඛ පරීක්ෂණය.**—ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබා ගන්නා සෑම අපේක්ෂකයෙකු විසින් ම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ද අවශ්‍ය විය හැකි දිනය හා වේලාව අදාළ ආයතනයන්හි ප්‍රධානියා විසින් ඔහුට දන්වනු ලැබේ.

7. **භාෂා මාධ්‍යය.**—සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් සාමාන්‍ය යාන්ත්‍රික දැනීම හා වෘත්තීය සඳහා ගණිතය යන ප්‍රශ්න පත්‍ර ඇති අතර ලිඛිත විභාගය සඳහා වන අනෙක් සියළුම ප්‍රශ්න පත්‍ර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ඇත.

8. **විභාගාපේක්ෂකයා ඇතුලත්වීමට බලාපොරොත්තුවන කාර්මික ආයතනය.**—එක අයදුම් කරුවෙකුට තරඟ කළ හැකිකේ එක් කාර්මික ආයතනයකට ඇතුලත්වීම සඳහා පමණය.

9. **කාල සටහන.**—පළමු දිනය

පෙරවරු 9.00 සිට පෙ.ව. 11.00 දක්වා ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම.
පෙරවරු 11.15 සිට පෙ.ව. 11.45 දක්වා සාමාන්‍ය බුද්ධිය.
පස්වරු 1.00 සිට ප.ව. 3.00 දක්වා ශුද්ධ ගණිතය.
පස්වරු 3.15 සිට ප.ව. 4.15 දක්වා රචනය (සිංහල/දෙමළ).

දෙවැනි දිනය

පෙ.ව. 8.30 සිට පෙ.ව. 9.30 දක්වා රචනය (ඉංග්‍රීසි).
පෙ.ව. 9.45 සිට පෙ.ව. 11.45 දක්වා අංක ගණිතය.
ප.ව. 12.30 සිට ප.ව. 2.30 දක්වා භෞතික විද්‍යාව.
ප.ව. 2.45 සිට ප.ව. 4.45 දක්වා වාණිජ අංක ගණිතය.

තුන්වැනි දිනය

පෙ.ව. 8.30 සිට පෙ.ව. 10.30 දක්වා මූලික ගණිතය.
පෙ.ව. 10.45 සිට ප.ව. 12.45 දක්වා ව්‍යවහාරික ගණිතය.
ප.ව. 1.45 සිට ප.ව. 3.45 දක්වා වෘත්තිය සඳහා අංක ගණිතය.
ප.ව. 4.00 සිට ප.ව. 4.45 දක්වා සාමාන්‍ය යාන්ත්‍රික දැනීම.

10. **ප්‍රවේශ විභාගයේ විෂයයන් පිළිබඳ නිර්දේශ පත්‍ර.**—(අ) ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, අංක ගණිතය, වාණිජ අංක ගණිතය, භෞතික විද්‍යාව, ජ්‍යාමිතික හා යාන්ත්‍රික දැනීම යන විෂයයන්හි නිර්දේශයන් අ. පො.ස. (සා.පෙ.) පරීක්ෂණයට මෙනි.

(ආ) මූලික ගණිතය, ප්‍රශ්න පත්‍රයේ වීජ ගණිතය, ජ්‍යාමිතිය සහ ත්‍රිකෝණමිතය සඳහා නිර්දේශයන් අ. පො.ස. (සා.පෙ.) ට සමාන නමුත් දෙනු ලබන ප්‍රශ්න වඩා මූලික අන්දමේ ඒවාය. සංකීර්ණ ගැටළුවලට හා සිද්ධාන්තවලට අදාළ ප්‍රශ්නවලට වඩා අවධානය වැඩියෙන් යොමු කෙරෙන්නේ යාන්ත්‍රික හා අපෝහණ ක්‍රමවලටය. අංක ගණිතය ප්‍රශ්න කිසිවක් දෙනු නො ලැබේ.

(ඉ) වෘත්තිය සඳහා අංක ගණිතය—ක්‍රම 4, ඉංග්‍රීසි හා මිනුම් ක්‍රම, සෘජු කෝණාශ්‍රය, චතුරශ්‍ර, සරල රේඛීක රූප, වෘත්ත ආදියේ වර්ග ඵල සහ පෙට්ටි, සිලින්ඩර, ගෝලවල පරිමාව.

(ඊ) රචනය—දී ඇති විෂයයන් කීපයකින් එකක් අපේක්ෂකයින් විසින් තෝරාගත යුතුවේ. ව්‍යාපාර, වාණිජ, කර්මාන්ත, විද්‍යා, ලෝක හා ප්‍රාදේශීය සිද්ධීන් හෝ ප්‍රශ්න ආදිය පිළිබඳව රචනා මාතෘකා දෙනු ලැබේ. නිවැරදි පැහැදිළි භාෂාව හා තර්කානුකූල චින්තන ශක්තිය වර්ධනය කෙරෙහි වැඩි සැළකිලි දක්වනු ලැබේ.

(උ) සාමාන්‍ය යාන්ත්‍රික දැනීම—සාමාන්‍ය කර්මාන්තශාලා උපකරණ, යන්ත්‍ර ආදිය ගැන අපේක්ෂකයාගේ අවබෝධය සඳහා ප්‍රශ්න පත්‍ර දෙනු ලැබේ.

11. **ගාස්තු.**—(i) අංක 1 සිට 19 දක්වා පාඨමාලා සඳහා විභාග ගාස්තු රුපියල් 15 ක් වන අතර අංක 20 සිට 39 දක්වා පාඨමාලා සඳහා විභාග ගාස්තු රුපියල් 10 කි. සෑම අතිරේක පාඨමාලාවකටම රුපියල් 5 ක් ගෙවිය යුතුවේ.

(ii) ගාස්තු ගෙවිය යුතු වන්නේ ආකෘති පත්‍රයේ ආදයම් මුද්දර ඇලවීමෙනි. අයදුම්කරුගේ අත්සන හා දතම යොදමින් එම මුද්දර අවලංගු කළ යුතුය. අවලංගු නොකර එවනු ලබන මුද්දර සඳහා දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

12. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) රෙගුලාසි අනුව හා අවශ්‍ය ගාස්තු සමඟ අයදුම්පත් ඉදිරිපත් කර තිබෙන සියළුම අපේක්ෂකයින් විභාගයට ඇතුළත් කරනු ලැබේ.

(ii) විභාගයට ඇතුළත් කර ගැනීම සුදුසුකම පිළිගත් න්‍යායයෙන් සැලකිය නොහැක. විභාගය සඳහා නුසුදුසු යයි පෙනී ගිය හෝ අවශ්‍ය තොරතුරු සඟවන ලද හෝ වැරදි තොරතුරු සපයන ලද හෝ අපේක්ෂකයෙකු විභාගය පැවැත්වෙන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ පාඨමාලාවක් තුලදී හෝ පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව වුවද හෝ විභාගය සඳහා නුසුදුස්සෙකු වේ.

13. **ඇතුල්වීම.**—(i) මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ආකෘති පත්‍ර පමණක් පාවිච්චි කළ යුතුය. මාර්තු මස 1 සිට 7 වැනි දින දක්වා මෙම ආකෘති පත්‍ර තම ලිපිනය ලියා මුද්දර නොමැති දිගු කවරයක් එවා ඉල්ලන සෑම කෙනෙකුටම තැපැලෙන් නිකුත් කරනු ලැබේ. මෙම කවරවල වම් පැත්තේ උඩ කෙළවරේ එස්ජී යන්න සඳහන් කළ යුතුය. මෙම ආකෘති පත්‍ර පැමිණ ඉල්ලන අයට ඒ ඒ කාර්මික ආයතනවලින් මාර්තු 8 සිට 14 වැනි දින දක්වා හා මෙම කාර්යාලයෙන් මාර්තු 8 සිට 15 දක්වා ලබාගත හැක.

(ii) අපේක්ෂකයා විසින් ඇතුළත්වීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ වශයෙන් නිවැරදිව පිරවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රයක් ගැන සුදුසු පරිදි නිශ්චය කොට විභාගයට පෙර ප්‍රතික්ෂේප කිරීම හෝ විභාගයෙන් පසුව අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ගේ අවධානය පහත සඳහන් කරනු සඳහා යොමු කරවනු ලැබේ :—

(අ) රැකියාවේ නියුක්ත අපේක්ෂකයන් විසින් සිය ඇතුලත්වීමේ ආකෘති පත්‍ර, තම සේව්‍ය යෝජකයන්ගේ හෝ තම දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය ප්‍රධානීන් මගින් එවිය යුතුය.

(ආ) අපේක්ෂකයාගේ අත්සන සහතික කළයුත්තේ, ඒ සඳහා බලය ලත් තැනැත්තෙකු විසිනි. සේවයෙහි නියුක්ත අපේක්ෂකයින් සේව්‍ය යෝජකයා ලවා හෝ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය ප්‍රධානීන් ලවා සිය අත්සන සහතික කරවා ගත යුතුය.

(iii) සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර 1973 මාර්තු 15 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන්, කොළඹ 2, විභාග කොමසාරිස් වරයා වෙත එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිළිව ලියා තිබිය යුතුය.

(iv) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නො ලැබේ.

(v) ඉල්ලුම් පත්‍රයට ලිපි ලේඛන ඇමිණිය යුතු නොවේ.

14. (i) ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.—

(අ) අසම්පූර්ණ හෝ දොස් සහිත හෝ රෙගුලාසි අනුකූල නොවන,

(ආ) නියමිත ගාස්තු නොදරන,

(ඉ) ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව දෙපාර්තමේන්තුවට ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කොට, ඒ බව අදාළ අපේක්ෂකයාට දැනුම් දෙනු ලැබේ. අපේක්ෂකයා විභාගයට පෙනී සිටියේ නම්, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේදී හෝ අපේක්ෂකත්වය අවලංගු කිරීමේදී ගාස්තුව රාජසන්තක කරනු ලැබේ.

15. විභාගයෙන් ඉවත්වීම හෝ විභාගයට නොපැමිණ සිටීම හා ගාස්තු ආපසු ගෙවීම.—(i) විභාගයෙන් ඉවත්වීම සඳහා එවන දැන්වීම, ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට ප්‍රථම දෙපාර්තමේන්තුවට ලැබුණි නම්, ගෙවන ලද ගාස්තුවෙන් 90%ක් ආපසු ගෙවනු ලැබේ.

(ii) කවර කරුණක් සඳහා වුවද විභාගයට නොපැමිණ සිටීම ඇතුළුව වෙනත් සියළුම අවස්ථා සම්බන්ධයෙන් ගාස්තුව හෝ ඉන් කිසිම කොටසක් ආපසු ගෙවීම සඳහා අවසර දෙනු නො ලැබේ.

(iii) කෙසේවුව ද, අපේක්ෂකයා කිසිම ප්‍රශ්න පත්‍රයකට හෝ පෙනී නොසිටියේ නම්, ඔහුගේ මරණය හෝ ඔහුට වැළඳී ඇති ඉතා බලගතු හෝ කල්ගතවන රෝගයක් (නි.ව. ක්ෂය රෝගය, අංශ භාගය, මානසික හෝ තහරගත රෝග) හේතු කොටගෙන ගාස්තුවෙන් සියයට 90 ක මුදලක් ආපසු ගෙවනු ලැබේ. එවැනි ආපසු ගෙවීමක් ඉල්ලුම් කිරීමේ අයදුම්පත, විභාගය අවසාන දින සිට දින 30 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළයුතු වේ.

16. ප්‍රවේශ පත්‍ර.—(i) විභාගය පැවැත්වීමට දින 7 කට පමණ පෙර, පුවත් පත් මගින් හා ගුවන් විදුලිය මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ බව සඳහන් දැන්වීමක් කරනු ලැබේ. එවැනි දැන්වීමක් ගැන සෑම අයදුම්කරුවෙක්ම සැලකිල්ලෙන් සිට, එහි සඳහන් උපදෙස් අනුව වහා ක්‍රියා කළ යුතුය.

(ii) යම් හෙයකින් අයදුම්කරුවෙකුට ප්‍රවේශ පත්‍රයක් නොලැබුන හොත් ඔහු විසින් කොළඹ 2, කොම්පඤ්ඤ වීදියේ, මැලේ වීදියේ විභාග දෙපාර්ත මේන්තුව වෙත ප්‍රවේශ පත්‍රය නොලැබුන බව නොපමාව දන්වා එවිය යුතුය. (විදුලි පුවතකින් මෙසේ දැන්වීම වඩා හොඳය) (විදුලි පණිවුඩ ලිපිනය " විභාග " කොළඹ) පැමිණ විමසන අපේක්ෂකයන් මෙම දෙපාර්තමේන්තුවේ දත්ත සැකසුම් ශාඛාවෙන් තොරතුරු විමසිය යුතුය. එවිට පහත සඳහන් තොරතුරු සැපයිය යුතුවේ :—

(අ) විභාගයේ නම ;

(ආ) අයදුම්කරුගේ සම්පූර්ණ නම ;

(ඇ) අයදුම්කරුගේ ලිපිනය ;

(ඈ) විභාගයට නේප සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථානය ;

(ඉ) අයදුම් පත්‍රය එවූ දිනය, ලියාපදිංචි කළ තැපැල් කාර්යාලයය, ලියාපදිංචි කළ අංකය.

17. හැඳින්වීමේ පත්‍ර.—(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී එක් එක් විෂයයට පෙනී සිටින විට විභාගශාලාධිපතීන්ට පිළිගත හැකි පරිදි තමා පිළිබඳ අනන්‍යතාවය ඔප්පු කිරීම අවශ්‍ය වේ. මේ සඳහා පහත දැක්වෙන ලියවිලි වලින් කවර හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල්තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක්.

(ආ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක්.

(ඉ) විභාග දිනට කලින් තුන් අවුරුද්දක් ඇතුළත නිකුත් කරන ලද වලංගුව පවත්නා පාස්පෝට් බලපත්‍රයක්.

(ඊ) විභාග දිනට කලින් තුන් අවුරුද්දක් තුල රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රජයේ සංස්ථාවක් මගින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් වෙනත් ආයතනකින් හෝ නිකුත් කරන ලද්දාවූ ද, තම ඡායාරූපය දරන්නාවූ ද, සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්,

(උ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින්, පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසුපිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරන ඡායාරූපයක් :—

පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ...................................................... යන අයගේ බව, මම සහතික කරමි.

(අයදුමකරුගේ සම්පූර්ණ නම)

................,
අයදුම්කරුගේ පුරුදු අත්සන.

................,
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

නම සහ තරාතිරම ................................

දිනය :.............................

මෙම ඡායාරූප පිටපත විභාගශාලාධිපති වෙත රඳවා ගනු ලැබේ. ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි ඉල්ලුම්කරුවකුගේ අපේක්ෂකත්වය තාවකාලික ලෙස සලකනු ලැබේ. එම අපේක්ෂකත්වය විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

18. ලිපිලේඛනාදිය.—(i) පහත සඳහන් ලිපිලේඛන වලින් සමහරක් හෝ සියල්ලම හෝ අවශ්‍යවනු ඇත :—

(අ) ප්‍රභූන් දෙදෙනෙකුගේ චරිත සහතික. මෙම චරිත සහතික මෑතකදී ලබාගත් ඒවා විය යුතු අතර, අයදුම්කරු යටත් පිරිසෙයින් අවුරුදු පහකට වැඩි කාලයක් පෞද්ගලිකව හඳුනන තැනැත්තෙක් විය යුතුය. හොඳින්ම පිළිගත හැකි සහතික වන්නේ, පාසල් ප්‍රධානයන්ගෙන් හෝ අයදුම්කරු පදිංචිව සිටින නගරයේ හෝ ගමේ පදිංචි නිලධාරීන්ගෙන් ලබාගන්නා සහතික වේ.

(ආ) උප්පැන්න සහතික හෝ වයස් සීමාව දැක්වෙන විශේෂ සහතිකය.

(ඉ) ලාංකික පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි කරන ලද සහතික හෝ පරම්පරාවෙන් පුරවැසිභාවය ඉල්ලුම් කිරීම පිළිගැනීමේ රජයෙන් ලද මුල් ලිපිය (අදාළ පරිදි).

(ඊ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අ. පො.ස. සහතික පත්‍රය (හෝ මෙම සහතික පත්‍ර තවමත් නිකුත් කර නොමැති අවස්ථාවක් සම්බන්ධයෙන් බාහිර අපේක්ෂකයින් වෙත නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛණ හෝ පාඨශාලීය අපේක්ෂකයෙක් නම්, පාසැල් ප්‍රධානියාගෙන්ම ලබාගත් ප්‍රකාශයක්) මෙම ප්‍රකාශයට තම, විභාගය පවත්වන ලද මාසය හා වර්ෂය, විභාග අංකය, විෂය හා ශ්‍රේණිය යන කරුණු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් විය යුතුය.

(උ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ 8 වැනි ප්‍රමාණයේ සහතික පත්‍රය අවශ්‍ය තන්හි පාසල විසින් විධිමත් නිල වශයෙන් නිකුත් කරන ලද සහතික පත්‍රයක් හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සහතික පත්‍රයක් හෝ පාසල පිළිබඳ හා අයදුම්කරු පාසලට පැමිණි කාලපරිච්ඡේදය පිළිබඳව සම්පූර්ණ විස්තර දැක්වෙන පාසල් ප්‍රධානියා විසින්ම නිකුත් කරන ලද ප්‍රකාශයක්.

(ඌ) පාඨමාලාවකට ඇතුළත්වීම සඳහා අවශ්‍ය වන අධ්‍යාපනික සුදුසුකම් තහවුරු කරන වෙනත් කවර හෝ සහතික පත්‍රයක්.

(එ) අවශ්‍යවන පරිදි සේව්‍යයාගෙන් ලබාගත් සහතිකයක්.

(ii) මෙම ලිපිලේඛණ හෝ ඒවායේ පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළයුතු නොවේ. අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත්, පරීක්ෂක මණ්ඩලය විසින් පරීක්ෂා කිරීම සඳහා එම ලිපිලේඛණ සූදානමින් තැබිය යුතුය. සම්මුඛ පරීක්ෂණහේදී අවශ්‍ය හා පිළිගත හැකි ලිපිලේඛණ ඉදිරිපත් කර යෝග්‍යතාව ඔප්පු කිරීමට නොහැකි වන අයදුම්කරුවන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

(iii) උපදෙස් නොසලකා, අයදුම්පත් සමග ලිපිලේඛණ එවනු ලබන අයදුම්කරුවන්ගේ එම ලිපි ලේඛණ නැති වුවහොත්, ඒ ගැන දෙපාර්තමේන්තුව විසින් වග නොකියනු ඇත.

(iv) සිය ලිපි ලේඛණවල සත්‍යාසත්‍යතාවය පිළිබඳ අයදුම්කරු සම්පූර්ණයෙන්ම වග කිව යුතුය. වංචනිකව වෙනස් කළ හෝ හොර අත්සන් තබන ලද හෝ සඳහන් කරුණු අසත්‍ය වන හෝ ලිපිලේඛණ ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට තදබල දඬුවම් පමුණුවනු ලැබේ.

19. මෙහි රෙගුලාසිවල අඩංගු නොවන කිසියම් කරුණක් වේ නම්, ඒ පිළිබඳව අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් තුමා සමඟ සාකච්ඡාකොට, විභාග කොමසාරිස්වරයාගේ අභිමතය අනුව ක්‍රියාකරනු ලැබේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

## II උප ලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| 1. ආධුනික සැලසුම්කරු සහතිකය ... | පූර්ණ දිවාකාල—එක් අවුරුදු ... | අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විභාගයේ විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම, එම විෂයයන් හය, (අ) ශුද්ධ ගණිතය (ආ) සිංහල භාෂාව/දෙමළ භාෂාව/ඉංග්‍රීසි භාෂාව හා (ඉ) වෙනත් විෂයයන් හතරක් විය යුතු ය. නැතහොත් ගණිතය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ලබා තිබිය යුතු ය. (ගණිතයෙන් සාමාර්ථය වෙනම අවස්ථාවක අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ලබා තිබිය හැකි යි.<br>වයස 1974.1.1 දිනට අවුරුදු 17 කට නොඅඩු විය යුතු ය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය<br>(3) පහත සඳහන් විෂයයන් අතුරෙන් එකක් ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම | ... ගාල්ල (සිංහල), දෙහිවල (සිංහල), යාපනය (දෙමළ), මහනුවර (සිංහල), බහුතාක්ෂණික ආයතන සහ කුරුණෑගල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතනය |
| 2. මැනුම්කරු හා මට්ටම්කරු සහතිකය | පූර්ණ දිවාකාල—එක් අවුරුදු ... | දෙවරකට නොවැඩි වාර ගණනක දී ශුද්ධ ගණිතය සම්මාන සාමාර්ථයක් සහ (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි (ආ) භෞතික විද්‍යාව සහ (ඇ) විෂයයන් තුනක් සහිතව අ. පො. ස. (සා. පෙ.) විෂයයන් හයක් සහිතව සාමාර්ථය.<br>සැ.යු.—මෙම පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන (පිරිමි) සිසුන් දියතලාවේ මැණුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට ඇතුලත් වීමේ තරඟ විභාගයට ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති. ඒ සඳහා ශුද්ධ ගණිතය සහ භෞතික විද්‍යාව අ.පො.ස. (උසස් පෙළ) සාමාර්ථය ලබා ඇති අයට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ.<br>වයස 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු ය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය | ... දෙහිවල (සිංහල), ගාල්ල, (සිංහල), යාපනය, (දෙමළ), මහනුවර (සිංහල), බහුතාක්ෂණික ආයතනය, අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනය (සිංහල/දෙමළ) (නේවාසික පහසුකම් පිරිමින් සඳහා පමණි) බදුල්ල (සිංහල) කණිෂ්ඨ කාර්මික ආයතනය |
| 3. මැනුම්කරු හා මට්ටම්කරු සහතිකය | සන්ධ්‍යා—තුන් අවුරුදු ... | මැණුම්කරු හා මට්ටම්කරු පූර්ණකාල දිවා එක් අවුරුදු පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් හෝ ප්‍රාරම්භක ඉංජිනේරු විද්‍යා පාඨමාලාව සමත්වීම<br>වයස 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු ය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය | ... යාපනය (දෙමළ) , මහනුවර (සිංහල), ගාල්ල (සිංහල), බහුතාක්ෂණික ආයතනද, බදුල්ල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතනය |
| 4. සන්ධ්‍යා ඉංජිනේරු සහතිකය. (යාන්ත්‍රික/නාගරික/විදුලි/නිර්මාණ) | සන්ධ්‍යා—තුන් අවුරුදු ... | අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විභාගයේ විෂයයන් 6 කින් සාමාර්ථය ලබා තිබීම. එම විෂයයන් 6 (අ) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව/හෝ ඉංග්‍රීසි භාෂාව (ආ) ගණිතය (ඉ) භෞතික විද්‍යාව (ඊ) වෙනත් විෂයයන් තුනක් හෝ ගණිතය හා භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, ගණිතයෙන් හා භෞතික විද්‍යා වෙන් සාමාර්ථය වෙනත් අවස්ථාවක අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ලබා තිබිය හැකි ය. හෝ ඉංජිනේරු විද්‍යා ප්‍රාරම්භක පාඨමාලාව සම්පූර්ණකර තිබිය යුතු ය.<br>වයස 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය<br>(3) ව්‍යවහාරික ගණිතය<br>(4) භෞතික විද්‍යාව | ... යාපනය (දෙමළ), මහනුවර (සිංහල), ගාල්ල (සිංහල), බහුතාක්ෂණික ආයතනද, කුරුණෑගල (සිංහල), රත්මලාන (සිංහල), බදුල්ල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතන |
| 5. ගොඩනැගිලි නිර්මාණ සහතිකය ... | සන්ධ්‍යා—තුන් අවුරුදු ... | ආධුනික සැලසුම්කරු පාඨමාලාවට මෙනි. නැතහොත්, ඉංජිනේරු විද්‍යා ප්‍රාරම්භක පාඨමාලාව සම්පූර්ණ කොට තිබිය යුතුය.<br>වයස 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු ය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය | ... යාපනය (දෙමළ), මහනුවර (සිංහල), ගාල්ල (සිංහල), බහුතාක්ෂණික ආයතනද, අනුරාධපුරය (සිංහල), බදුල්ල (සිංහල), කෑගල්ල (සිංහල), කුරුණෑගල (සිංහල), රත්මලාන (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතන |
| 6. ගොඩනැගිලි නිර්මාණ සහතිකය ... | අර්ධකාල දිවා—තුන් අවුරුදු ... | අංක 5 දරණ පාඨමාලාවට මෙනි.<br>වයස 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය | ... යාපනය (දෙමළ), මහනුවර (සිංහල), දෙහිවල (සිංහල), ගාල්ල (සිංහල), බහුතාක්ෂණික ආයතන හා කුරුණෑගල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතනය |
| 7. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව. මෙම පාඨමාලාව පහත දක්වෙන විශේෂඥ ක්ෂේත්‍රයන්ගෙන් පැවැත්වේ :—<br>(අ) විගණනය<br>(ආ) පිරිවැය ගණකාධිකරණය<br>(ඉ) අලෙවිකරණය<br>(ඊ) කාර්මික සම්බන්ධතා | පූර්ණදිවාකාල—දෑවුරුදු ... | වයස 1974.1.1 දිනට අවු. 21ට අඩු නම් වඩා යෝග්‍යය. අපේක්ෂකයින් වයස අවු. 17ට අඩු නොවිය යුතු ය. අර්ථ ශාස්ත්‍රය, වාණිජ සහ මුදල්, ගණකාධිකරනය යන විෂයයන් තුනම හෝ එයින් දෙකක් සහ ආණ්ඩුක්‍රමය, ශුද්ධ ගණිතය, භූගෝල විද්‍යාව, දෙමළ, සිංහල, ඉංග්‍රීසි, තර්ක ශාස්ත්‍රය සහ ඉතිහාසය යන විෂයයන්ගෙන් එකක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) හෝ,<br>(ii) පොත් තබන්නන් සඳහා උසස් වාණිජ සහතික පත්‍රය, හෝ<br>(iii) පොත් තබන්නන් සඳහා වාණිජ විද්‍යා සහතික පත්‍රය, හෝ<br>(iv) පොත් තබන්නන් සඳහා වර්තක කරනන පත්‍රය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය<br>(3) වාක්‍ය රචනය | ... බහුතාක්ෂණිකායතනය, දෙහිවල (සිංහල), ගාල්ල (සිංහල), මහනුවර (සිංහල), යාපනය (දෙමළ) |

| | | | | |
|---|---|---|---|---|
| 8. | ඉංග්‍රීසි සඳහා ජාතික ඩිප්ලෝමාව ... | පූර්ණ දිවාකාල—දැවුරුදු ... | වයස ඉහත සඳහන් පරිදිය. —<br>(i) විෂයයන් තුනක් සහිතව අ.පො.ස (උ. පෙළ) සාමාර්ථය සහ ඉංග්‍රීසි භාෂාව (අ) නිර්දේශය හෝ ඉංග්‍රීසි සාහිත්‍යය සාමාර්ථය හෝ ඉංග්‍රීසි (ආ) නිර්දේශය සම්මාන සමග අ.පො.ස. (සා.පෙ.) සාමාර්ථයක් | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) වාක්‍ය රචනය<br>(මෙම ප්‍රශ්න පත්‍ර දෙකටම උත්තර සැපයිය යුත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි) ... බහුතාක්ෂණිකායතනය, දෙහිවල |
| 9. | තක්සේරු ශාස්ත්‍රය පුළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ... | පූර්ණකාල—දැවුරුදු, අර්ධකාල—දූවුරුදු | ගණිතයෙන් අ.පො.ස. (උ.පෙ.) සාමාර්ථයක් හෝ අ.පො.ස. සම්මාන සාමාර්ථයක් ද සහිතව අ.පො.ස. (උ.පෙ.) විෂයයන් 3 කින් සාමාර්ථය<br>ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින්ට අ.පො.ස. (සා.පෙ.) ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක් තිබිය යුතුය.<br>වයස 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු ය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය<br>(3) වාක්‍ය රචනය ... මරදානේ ලංකා කාර්මික විද්‍යාලයේ (ඉංග්‍රීසි/සිංහල) |
| 10. | වාණිජ විද්‍යා උසස් ජාතික ඩිප්ලෝමාව ... | පූර්ණකාල දිවා—සිව් අවුරුදු ... | පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් :—<br>(1) පොත් තබන්නන්ගේ උසස් වාණිජ විද්‍යා සහතික පත්‍රය ;<br>(2) අ.පො.ස. (උ.පෙ.) විෂයයන් 4 කින් සාමාර්ථය ලබා තිබීම ;<br>(3) මහරගම වාණිජ ගුරු පුහුණු සහතිකය හෝ,<br>(4) විභාග කොමසාරිස් විසින් පවත්වන ලද වාණිජ සහතික පත්‍ර විභාගය (ගණකාධිකරණ සහතිකය)<br>ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව සඳහා අ.පො.ස. (සා.පෙ.) ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br>වයස 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය<br>(3) වාක්‍ය රචනය ... මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල/ඉංග්‍රීසි) සහ යාපනය (දෙමළ), මහනුවර (සිංහල), දෙහිවල (සිංහල) බහුතාක්ෂණික ආයතන |
| 11. | ගණකාධිකරණ උසස් ජාතික ඩිප්ලෝමාව ... | සිව් අවුරුදු—සන්ධ්‍යා ... පාඨමාලාව | (1) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ; (2) පිළිගත් විශ්ව විද්‍යාලයක අන්තර් මධ්‍යම විභාගය හෝ : (3) ලන්ඩන් විශ්ව විද්‍යාලයේ උපාධි විභාගය කට පෙනී සිටීමට සුදුසුකම් ලැබෙන එම විශ්ව විද්‍යාලයේ අ.පො.ස. (උ.පෙ.) හෝ ; (4) අ.පො.ස. (උ.පෙ.) විෂයයන් 4ක් හෝ ; (5) ලංකා උසස් පාඨශාලා සහතික පත්‍රය හෝ ; (6) පොත් තබන්නන්ගේ උසස් වාණිජ විද්‍යාල සහතික පත්‍රය හෝ : (7) දැවුරුදු පූර්ණකාලීන කණිෂ්ඨ විශ්ව විද්‍යාලීය (හෝ බහුතාක්ෂණික ආයතනීය) ඩිප්ලෝමාව.<br>සංලක්ෂය.—කණිෂ්ඨ විශ්ව විද්‍යාලීය (හෝ බහුතාක්ෂණික ආයතනීය) පොත් තැබීම, පිරිවැය ක්‍රම හා ගණන් පරීක්ෂණ පරිචය ඩිප්ලෝමාධාරීන් පළමුවෙනි වර්ෂ අවසාන පරීක්ෂණයෙන් නිදහස් කොට, දෙවෙනි වර්ෂ පාඨමාලාවට කෙළින්ම බඳවා ගනු ලැබේ.<br>ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව සඳහා අමතර වශයෙන් ජො. ප. සා. විභාගයේ දී හෝ අ. පො. ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථය ලබා තිබිය යුතුය<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු ය.<br>සැ.යු.—ප්‍රායෝගික පළපුරුද්ද : අයදුම්කරුවන් පිළිගත් ව්‍යාපාරික ස්ථානයකට අයත් කාර්යාලයක හෝ රාජ්‍ය බල මණ්ඩලයක හෝ ආයතනයක නියුක්ත වූද, ගණන් තැබීමේ හෝ ගණන් පරීක්ෂණ කිරීමේ හෝ එබඳු ස්වභාවයෙකින් යුක්ත වූ ද හෝ කටයුතුවල නියුක්තවූවන් විය යුතු ය. | (1) සාමාන්‍ය බුද්ධිය– ...<br>(2) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය<br>(3) වාක්‍ය රචනය ... මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (දෙමළ/සිංහල/ඉංග්‍රීසි), යාපනය (දෙමළ) සහ මහනුවර(සිංහල), දෙහිවල (සිංහල), බහුතාක්ෂණික ආයතනය |
| 12. | ලේඛණාධිකරණ වෘත්තීය පාඨමාලාව | (1) පූර්ණකාල දිවා—සිව් අවුරුදු...<br>(2) අර්ධකකාල සන්ධ්‍යා—සිව් අවුරුදු | මින් එකක් (1) ලන්ඩන් මැට්‍රිකියුලේෂන් (2) ලංකා අ.පො.ස. (සා.පෙ. දෙවරකට නොවැඩි වාර ගණනක දී අනුමත කරන ලද විෂයයන් 6 කින් සමත් වී ඉංග්‍රීසි හා ගණිතය හෝ ස්වාභාවික විද්‍යා විෂයයන් ඇතුළු මෙයින් විෂයයන් 5 කින් සම්මාන සාමාර්ථය අපේක්ෂකයින් ලබා ඇත්නම්, යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ 4ක් එක් වරකදී ලබා තිබිය යුතුය.<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු ය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය<br>(3) වාක්‍ය රචනය ... මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (ඉංග්‍රීසි) |

| | | | | |
|---|---|---|---|---|
| 13. බැංකු ක්‍රම පිළිබඳ වෘත්තීය පාඨමාලාව | තුන් අවුරුදු—සන්ධ්‍යා පාඨමාලාව | (1) ඉංග්‍රීසි භාෂාවෙන් හා ගණිතයෙන් හෝ අංක ගණිතයෙන් හෝ වාණිජ අංක ගණිතයෙන් ලබා ඇති සාමාර්ථ සමග ලංකා ජො. පා. ස. (3) ඉංග්‍රීසි භාෂාවෙන් හා ගණිතයෙන් හෝ අංක ගණිතයෙන් හෝ වාණිජ අංක ගණිතයෙන් ලබා ඇති සාමාර්ථය සමග දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6කින් ලංකා අ. පො. ස. (සා පෙ) සාමාර්ථය.<br>සටහන.—අපේක්ෂකයා ලන්ඩන් බැංකුකරුවන්ගේ ආයතනයේ මණ්ඩලයක් මගින් අනුමත කරන ලද බැංකුවක නියුක්ත වූවකු විය යුතු ය.<br>වයස : 1974.1.1 දිනට වයස අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ... ...<br>(2) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය<br>(3) වාක්‍ය රචනය | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (ඉංග්‍රීසි) |
| 14. පිරිවැය ගණකාධිකරණ වෘත්තීය පාඨමාලාව | පූර්ණකාල දිවා–තුන් අවුරුදු, අර්ධ කාල සන්ධ්‍යා–තුන් අවුරුදු | (1) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ලංකා ජො. පා. ස. විභාගය (ඉංග්‍රීසි) හෝ ; (2) ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ඇතුළුව දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් අ.පො.ස. (සා .පෙ.) සාමාර්ථය හෝ ; (3) පිරිවැය හා ගණකාධිවරුන්ගේ ආයතනයේ ශිෂ්‍යයකු වීම.<br>වයස : 1971.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු ය. | (1) සාමාන්‍ය බුද්ධිය ... ...<br>(2) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය<br>(3) වාක්‍ය රචනය | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (ඉංග්‍රීසි) |
| 15. ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ජාතික සහතිකය<br>මෙම පාඨමාලාව පහත දක්වෙන විශෙෂඥ ක්ෂෙත්‍රයන්ගෙන් පැවැත් වේ :—<br>(1) ගණකාධිකරණය<br>(2) අලෙවිකරණය<br>(3) පරිපාලන පරිචය<br>(4) කාර්මික සම්බන්ධතා<br>(5) ප්‍රවාහනය<br>(6) ලඝු ලේඛණය<br>මෙම පාඨමාලාව පවත්වන්නේ වාණිජ විද්‍යා සහතික පත්‍ර (පොත් තැබීම සහ ලඝුලේඛනය/යතුරුලියන) පාඨමාලා වෙනුවට බව සැලකිය යුතුයි. | දෑවුරුදු—දිවා ... | ගණිතය හෝ අංක ගණිතය හෝ වානිජ අංක ගණිතය සහ සිංහල භාෂාව (සිංහල මාධ්‍ය අපේක්ෂකයින් සඳහා) හෝ දෙමළ භාෂාව (දෙමළ මාධ්‍ය අපේක්ෂකයින් සඳහා) හෝ ඉංග්‍රීසි භාෂාව (ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයින් සඳහා) ඇතුළුව දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො. ස. (සා.පෙ.) සාමාර්ථය<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ... ...<br>(2) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය<br>(3) රචනය (සිංහල මාධ්‍ය අපේක්ෂකයින් රචනයට පෙනී සිටිය යුත්තේ සිංහලෙනි. දෙමළ මාධ්‍ය අපේක්ෂකයින් දෙමළෙන් හා ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයින් ඉංග්‍රීසියෙන් පෙනී සිටිය යුතුය). | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල/ ඉංග්‍රීසි), ගාල්ල (සිංහල), මහනුවර (සිංහල), යාපනය (දෙමළ), දෙහිවල (සිංහල), බහුතාක්ෂණිකායතනද, බදුල්ල (සිංහල), කෑගල්ල (සිංහල), කුරුණෑගල, (සිංහල) කණිෂ්ඨ කාර්මික ආයතනය. |
| 16. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය<br>(විශෙෂඥ ක්ෂෙත්‍රයන් අංක 15 පාඨමාලාවට මෙනි) | සන්ධ්‍යා–දෑවුරුදු ...<br>(පිළිගත් ව්‍යාපාරික ස්ථානයක, කාර්යාලයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ වෙනත් පිළිගත් ආයතනයක රැකියාවක නියුක්ත වූවන් ට සීමා වේ) ... | සුදුසුකම් ඉහතින් ඇති පාඨමාලාවට මෙනි. ... ...<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | පොත් තබන්නන්ගේ වාණිජ සහතිකයට මෙනි. අංක 15 පාඨමාලාවට මෙනි. | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (ඉංග්‍රීසි/ සිංහල), ගාල්ල (සිංහල), මහනුවර (සිංහල) යාපනය (දෙමළ), බහුතාක්ෂණික ආයතන ද, බදුල්ල (සිංහල), කෑගල්ල (සිංහල,) කුරුණෑගල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතන. |
| 17. විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය පිළිබඳ සහතිකය | එක් අවුරුදු පාඨමාලාව–සෙනසුරාද (අපරභාග) පමණයි. විකුණුම් කටයුතුවල නියුක්තවූවන්ට සීමා වේ. | දෙකකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව/ඉංග්‍රීසි භාෂාව ඇතුළු ව විෂයයන් 6 කින් අ. පො. ස. (සා.පෙ.) සිංහල මාධ්‍ය අපේක්ෂකයින් සඳහා සිංහල භාෂාව හා ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයින් සඳහා ඉංග්‍රීසි භාෂාව.<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සමාන්‍ය බුද්ධිය ... ...<br>(2) රචනය (වාක්‍ය රචනයට සිංහල මාධ්‍ය අපේක්ෂකයින් සිංහලෙන් ද, ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයින් ඉංග්‍රීසියෙන් ද පෙනී සිටිය යුතුය.) | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (ඉංග්‍රීසි/ සිංහල) |
| 18. ලඝුලේඛන සහතිකය ... | එක් අවුරුදු—දිවා ... | විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය පාඨමාලාව මෙනි. දෙමළ මාධ්‍ය අපේක්ෂකයින් අ.පො. ස. (සා.පෙ.) විභාගයේ දෙමළ විෂයයෙන් සමත් විය යුතු ය.<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු ය. | විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය පාඨමාලාවට මෙනි. දෙමළ මාධ්‍ය අපේක්ෂකයින් රචනයට දෙමළෙන් පෙනී සිටිය යුතු ය. | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල/ ඉංග්‍රීසි) සහ යාපනය (දෙමළ), දෙහිවල (සිංහල), බහුතාක්ෂණිකායතනය |

| | | | | |
|---|---|---|---|---|
| 19. ලඝුලේඛන සහතිකය ... | එක් අවුරුදු සන්ධ්‍යා-මෙම ක්ෂෙත්‍රයේ හෝ අදාල ක්ෂෙත්‍රයක නියුක්ත වූවන්ට සීමා වේ. | දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙ.) සිංහල මාධ්‍ය අපේක්ෂකයින් සඳහා සිංහල භාෂාව. දෙමළ මාධ්‍ය සහ ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයින් සඳහා ඉංග්‍රීසි භාෂාව.<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ... ...<br>(2) රචනය (රචනයට සිංහල මාධ්‍ය අපේක්ෂකයින් සිංහල, දෙමළ මාධ්‍ය අපේක්ෂකයින් දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයින් ඉංග්‍රීසි යෙන් ද පෙනී සිටිය යුතුය) | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල/ ඉංග්‍රීසි), සහ යාපනය (දෙමළ), මහනුවර (සිංහල), බහුතාක්ෂණික ආයතන |
| 20. ප්‍රාරම්භක ඉංජිනේරු විද්‍යා සහතිකය | සන්ධ්‍යා-එක් අවුරුදු ... | 8 වෙනි ශ්‍රෙණිය හෝ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය. වයස 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. මෙම පාඨමාලාව පවත්වනු ලබන්නේ අ.පො.ස. (සා.පෙ.) පරීක්ෂණය සඳහා විද්‍යා විෂයයන් ඉගෙනීමට අපොහොසත් වූ සිසුන් සඳහා පමණි. මෙය සමත් සිසුන් සන්ධ්‍යා ඉංජිනේරු පාඨමාලාවලට බඳවා ගනු ලැබේ. | (1) සාමාන්‍ය බුද්ධිය ... ...<br>(2) මූලික ගණිතය ... | යාපනයේ බහුතාක්ෂණිකායතනයේ දෙමළ මාධ්‍යයෙන් ද, මහනුවර හා ගාල්ල යන බහුතාක්ෂණිකායතනයන්හි ද, අනුරාධපුර, බදුල්ල, කෑගල්ල, කුරුණෑගල හා රත්මලාන කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි සිංහල මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ. |
| **ජාතික වෘත්තීය සහතික පාඨමාලාව :—** | | | | |
| 21. යන්ත්‍රණය ... ... | — ... | 8 වැනි ශ්‍රෙණිය හෝ 8 වැනි ප්‍රමාණය ... ... ...<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 18ට නොවැඩි විය යුතුය. | (1) සාමාන්‍ය යාන්ත්‍රික දනීම ...<br>(2) වෘත්තීය සඳහා ගණිතය | අංක 21, 22, 23, 24 සහ 26 දරණ විෂය මාලාවන් යාපනයේ බහුතාක්ෂණිකායතනයේ දෙමළ මාධ්‍යයෙන් ද, ගාල්ල සහ මහනුවර බහුතාක්ෂණික ආයතනවල හා මරදානේ ලංකා කාර්මික විද්‍යාලය ., අනුරාධපුර, බදුල්ල කෑගල්ල, කුරුණෑගල, රත්මලාන යන කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි සිංහල මාධ්‍යයෙන් ද පැවැත් වේ. අංක 25 දරණ විෂයමාලා අනුරාධපුර, කුරුණෑගල, රත්මලාන යන කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි ද, මරදානේ ලංකා කාර්මික විද්‍යාලයේ ද, ගාල්ලේ බහුතාක්ෂණිකයතනයේද, සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ අංක. 27, 28 යන විෂය මාලා රත්මලානේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ සිංහල මාධ්‍යයෙන් ද, අංක. 29 දරණ පාඨමාලාව යාපනයේ බහුතාක්ෂණිකායතනයේ දෙමළ මාධ්‍යයෙන් හා මරදානේ ලංකා කාර්මික විද්‍යාලයේ සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. |
| 22. ස්වයංක්‍රිය යාන්ත්‍රික විද්‍යාව ... | — ... | එම ... ... ... ... | | |
| 23. වඩුවැඩ සහ වැද්දුම් වැඩ ... | — ... | එම ... ... ... ... | | |
| 24. ගොඩනැගිලිවල විදුලි උපකරණ සවි කිරීම | — ... | එම ... ... ... ... | | |
| 25. පෙදරේරු ශිල්පය ... | — ... | එම ... ... ... ... | | |
| 26. හේත්තු වැද්දීම ... | — ... | එම ... ... ... ... | | |
| 27. ලෝහ තහඩු වැඩ ... | — ... | එම ... ... ... ... | | |
| 28. විදුලි යාන්ත්‍රික විද්‍යාව ... | — ... | එම ... ... ... ... | | |
| 29. රේඩියෝ සහ ඉලෙක්ට්‍රොනික් යාන්ත්‍රික ශිල්පය | — ... | එම ... ... ... ... | | |
| 30. ජලනල සවි කිරීම පිළිබඳ සහතිකය ... | අර්ධකාල- සන්ධ්‍යා එක් අවුරුදු (මෙම වෘත්තීයේ නියුක්ත වූවන් ට සීමාවේ) | 8 වැනි ශ්‍රෙණිය හෝ 8 වැනි ප්‍රමාණය හෝ කණිෂ්ඨ පාඨශාලා සහතිකය (රජයේ හෝ පලාත් පාලන සේවයේ නියුක්ත වූවන් සඳහා මෙම අවශ්‍යතාව ලිහිල් කරනු ලැබේ).<br>වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය යාන්ත්‍රික දනීම ...<br>(2) වෘත්තීය සඳහා අංක ගණිතය | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල), යාපනය (දෙමළ), මහනුවර (සිංහල), බහුතාක්ෂණික ආයතනද, අනුරාධපුර (සිංහල), කුරුණෑගල (සිංහල) බදුල්ල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතන |
| 31. ඔර්ලෝසු අළුත්වැඩියා කිරීම පිළිබඳ සහතිකය | අර්ධකාල-සන්ධ්‍යා එක් අවුරුදු (මෙම වෘත්තීයේ නියුක්ත වූවන් ට සීමාවේ) | එම ... ... ... ... | එම ... ... | මහනුවර (සිංහල), බහුතාක්ෂණික ආයතන |
| 32. ගුවන් විදුලි යන්ත්‍ර සේවා කිරීම පිළිබඳ සහතිකය | එම ... | එම ... ... ... ... | එම ... ... | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල), යාපනය (දෙමළ), බහුතාක්ෂණික ආයතනය අනුරාධපුර (සිංහල) කෑගල්ල (සිංහල) සහ කුරුණෑගල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතන |

| | | | | |
|---|---|---|---|---|
| 33. විදුලි කම්බි ඇදීම පිළිබඳ සහතිකය ... | අර්ධකාල – සන්ධ්‍යා එක් අවුරුදු ... (මෙම වෘත්තියේ නියුක්ත වූවන්ට සීමා වේ) | 8 වැනි ශ්‍රේණිය හෝ 8 වැනි ප්‍රමාණය හෝ කණිෂ්ඨ පාඨශාලා සහතිකය (රජයේ හෝ පලාත්පාලන සේවයේ නියුක්තවූවන් සඳහා මෙම අවශ්‍යතාව ලිහිල් කරනු ලැබේ.) වයස : 1974.1.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය යාන්ත්‍රික දනිම (2) වෘත්තිය සඳහා අංක ගණිතය ... | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල) අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනය (සිංහල), අනුරාධපුර (සිංහල), බදුල්ල (සිංහල) කෑගල්ල (සිංහල), කුරුණෑගල (සිංහල) කණිෂ්ඨ කාර්මික ආයතන සහ යාපනය (දෙමළ) ගාල්ල (සිංහල), බහු තාක්ෂණික ආයතන |
| 34. වර්ණ යෝජනය පිළිබඳ සහතිකය ... | එම ... | එම ... ... ... ... | එම ... ... | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල) |
| 35. ලෙටර් ප්‍රෙස් මැෂින් වැඩ පිළිබඳ සහතිකය | එම ... | එම ... ... ... ... | එම ... ... | එම |
| 36. පොත් බැඳීම පිළිබඳ සහතිකය ... | එම ... | එම ... ... ... ... | එම ... ... | එම |
| 37. වඩු සටහන් ඇඳීම පිළිබඳ සහතිකය ... | එම ... | එම ... ... ... ... | එම ... ... | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල), මහනුවර (සිංහල), බහුතාක්ෂණික ආයතන යද අනුරාධපුර (සිංහල), බදුල්ල (සිංහල) කණිෂ්ඨ කාර්මික ආයතන |
| 38. හේත්තු වැද්දීම පිළිබඳ සහතිකය ... | තුන් අවුරුදු–සන්ධ්‍යා (මේ වෘත්තියෙහි නියුක්ත වූවන්ට සීමාවේ) | එම ... ... ... ... | එම ... ... | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල), යාපනය (දෙමළ), මහනුවර (සිංහල), බහුතාක්ෂණික ආයතනද, කුරුණෑගල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතන |
| 39. යන්ත්‍රහල් පුහුණුව පිළිබඳ සහතිකය ... | එම ... | එම ... ... ... ... | එම ... ... | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල), යාපනය (දෙමළ), මහනුවර (සිංහල), බහුතාක්ෂණික ආයතන ද. |

2—289—73.02.09 දින අංක 46 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සෑ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජනවාරි | 73. 1. 5 | සිකුරාද | 72.12.27 | බදාද | දවල් 12.00 |
| | 73. 1.12 | සිකුරාද | 73. 1. 3 | බදාද | දවල් 12.00 |
| | 73. 1.19 | සිකුරාද | 73. 1.10 | බදාද | දවල් 12.00 |
| | 73. 1.26 | සිකුරාද | 73. 1.17 | බදාද | දවල් 12.00 |
| පෙබරවාරි | 73. 2. 2 | සිකුරාද | 73. 1.24 | බදාද | දවල් 12.00 |
| | 73. 2. 9 | සිකුරාද | 73. 1.31 | බදාද | දවල් 12.00 |
| | 73. 2.15 | බ්‍රහස්පතින්ද | 73. 2. 7 | බදාද | දවල් 12.00 |
| | 73. 2.23 | සිකුරාද | 73. 2.14 | බදාද | දවල් 12.00 |
| මාර්තු | 73. 3. 2 | සිකුරාද | 73. 2.21 | බදාද | දවල් 12.00 |
| | 73. 3. 9 | සිකුරාද | 73. 2.28 | බදාද | දවල් 12.00 |
| | 73. 3.16 | සිකුරාද | 73. 3. 7 | බදාද | දවල් 12.00 |
| | 73. 5.23 | සිකුරාද | 73. 3.14 | බදාද | දවල් 12.00 |
| | 73. 3.30 | සිකුරාද | 73. 3.21 | බදාද | දවල් 12.00 |
| අප්‍රේල් | 73. 4. 4 | සිකුරාද | 73. 3.28 | බදාද | දවල් 12.00 |
| | 73. 4.11 | බදාද | 73. 4. 4 | බදාද | දවල් 12.00 |
| | 73. 4.19 | බ්‍රහස්පතින්ද | 73. 4.11 | බදාද | දවල් 12.00 |
| | 73. 4.27 | සිකුරාද | 73. 4.18 | බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.